278 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 278 - இல. 08
Volume 278 - No. 08

2020 ඔක්තෝබර් 09 වන සිකුරාදා
2020 ஒக்ரோபர் 09, வெள்ளிக்கிழமை
Friday, 09th October, 2020

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

---

# PRINCIPAL CONTENTS

**ORAL ANSWERS TO QUESTIONS**

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2020 ඔක්තෝබර් 09 වන සිකුරාදා***

*2020 ஒக்ரோபர் 09, வெள்ளிக்கிழமை*

*Friday, 09th October, 2020*

**පූ. භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**

*பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.*
*சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.*

The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

* 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජුනි 30 දිනැති අංක 2182/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය; සහ

* 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජුනි 30 දිනැති අංක 2182/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය. - [වෙළඳ අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - சிறைச்சாலைகள் மறுசீரமைப்பு மற்றும் சிறைக்கைதிகள் புனர்வாழ்வளிப்பு இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Prison Reforms and Prisoners' Rehabilitation)

ගරු කථානායකතුමනි, උඩුගම්පොල, කෙහෙල්බද්දර, නාගස්මණ්ඩිය පාර, අංක 58/සී දරන ස්ථානයෙහි පදිංචි ස්ටැන්ලි අබේසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ජයරත්න හේරත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, ගල්ගමුව, අරසන්වැව, අංක 05 දරන ස්ථානයෙහි පදිංචි එච්.ජී. විල්බට් පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අලෙවිය හා භාවිතය: විස්තර
### சட்ட விரோத போதைப்பொருள் விற்பனை மற்றும் பயன்பாடு: விபரம்
### SALE AND USE OF ILLICIT DRUGS: DETAILS

**1. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015.02.01 දින සිට මේ දක්වා නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අලෙවිය හා භාවිතය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නීතිවිරෝධී මත්ද්‍රව්‍ය මර්දනය කිරීම සඳහා ක්‍රියා කරනු ලබන රාජ්‍ය හෝ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය මඟින් අත්අඩංගුවට ගනු ලැබූ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்டவினா:

(அ) (i) 2015.02.01 ஆம் திகதி தொடக்கம் இதுவரை சட்ட விரோத போதைப் பொருள் விற்பனை மற்றும் பயன்பாடு சம்பந்தமாக கைது செய்யப்பட்ட நபர்களின் எண்ணிக்கை ஒவ்வொரு வருடத்தின் பிரகாரம் தனித்தனியாக யாதென்பதையும்;

[ගරු හේෂා විතානගේ මහතා]

(ii) சட்ட விரோத போதைப் பொருள் ஒழிப்பு நடவடிக்கைகளில் ஈடுபட்டுவருகின்ற அரச அல்லது அரச அனுசரணை பெற்றுள்ள நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு நிறுவனத்தினால் கைதுசெய்யப்பட்டுள்ள சட்ட விரோத போதைப் பொருளின் அளவு வெவ்வேறாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Will he inform this House-

(i) the number of persons arrested on charges of selling and using illicit drugs from 01.02.2015 up to now in respect of each year, separately;

(ii) the names of the government institutions and government sponsored institutions that take measures to control illicit drugs; and

(iii) the amount of illicit drugs that had been taken into custody by each of the aforesaid institutions, separately?

(b) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் உள்ளகப் பாதுகாப்பு, உள்நாட்டலுவல்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation and State Minister of Internal Security, Home Affairs and Disaster Management)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| වර්ෂය | අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|
| 2015 | 73444 |
| 2016 | 75304 |
| 2017 | 81156 |
| 2018 | 96489 |
| 2019 | 89308 |
| 2020.09.18වන විට | 54505 |

(ii)

ශ්‍රී ලංකා පොලීසිය

ශ්‍රී ලංකා රේගුව

සුරාබදු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා නාවික හමුදාව

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ශ්‍රී ලංකා යුද හමුදාව

බන්ධනාගාරය

(iii) 2015.02.01 දින සිට 2020.09.18වන දින දක්වා එක් එක් ආයතනය මඟින් අත්අඩංගුවට ගනු ලැබූ මත්ද්‍රව්‍ය ප්‍රමාණය

| ආයතනය | මත්ද්‍රව්‍ය ප්‍රමාණය (කි.ග්‍රෑ) | මත්පෙති ප්‍රමාණය |
|---|---|---|
| ශ්‍රී ලංකා පොලීසිය | 40851.903 | 15420470 |
| ශ්‍රී ලංකා රේගුව | 197.254 | 328745 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 5107.709 | 17 |
| බන්ධනාගාරය | 0.279 | 24 |
| සුරාබදු දෙපාර්තමේන්තුව | 160.978 | 0 |
| ශ්‍රී ලංකා යුද හමුදාව | 157.775 | 0 |

(ආ) පැන නොනඟී.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ස්තුතියි, ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමාගේ පිළිතුරට අනුව, මේ රටේ පසුගිය වසර පහක කාලසීමාව පුරා වැඩිම මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ ශ්‍රී ලංකා පොලීසිය. ඔබතුමාගේ පිළිතුර අනුව, පොලීසිය මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 40,851ක් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඊළඟට තමයි නාවික හමුදාව ඉන්නේ.

ගරු ඇමතිතුමනි, මගේ අතුරු ප්‍රශ්නය මම අහනවා. පොලීසිය වැඩි ප්‍රමාණයක්, ඒ කියන්නේ කිලෝ ග්‍රෑම් 40,851ක සහ නාවික හමුදාව දෙවනුව කිලෝ ග්‍රෑම් 5,107ක මත් ද්‍රව්‍ය අත් අඩංගුවට ගැනීම කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම ඊයේත් ඇසූ ප්‍රශ්නයට සමාන ප්‍රශ්නයක් අදත් අහන්නේ. මේ දවස්වල කොරෝනා ප්‍රශ්නයට අමතරව, මත් ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් පිළිබඳ විස්තරත් හැම දාම රූපවාහිනියෙන් අපි දකිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ප්‍රශ්නයට එන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය අහන්න ඔච්චර දුර ගියොත්, වෙලාව පිළිබඳව ලොකු ගැටලුවක් එනවා. [බාධා කිරීම්]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, එච්චර හදිසි වෙන්න එපා. අපි ජනතා ප්‍රශ්න අහන්නේ. ඔබතුමා බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්ව එක අහලා නැහැනේ. [බාධා කිරීම්] එහෙම කරන්න එපා. ප්‍රශ්නය අහන්න එතුමාට ඉඩ දෙන්න.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේ අත්අඩංගුවට ගැනීම් සිදු කරන ආයතනවල ඉන්න නිලධාරීන් සහ මේ මත් කුඩු ජාවාරම් කරන ප්‍රධානීන් සම්බන්ධවයි. අපි ඊයේ කිව්වා, දේශපාලනඥයන් මේකට සම්බන්ධයි,මේ රටේ ඉතා විශාල ධනවතුන් මේකට සම්බන්ධයි කියලා. අන්න ඒ කණ්ඩායමත් එක්ක මේ ආයතනවල ප්‍රධානීන් අතර යම් සම්බන්ධතාවක් තිබෙනවා කියලා රටේ කථාවක් තිබෙනවා. ඒක සත්‍යයක් කියලා මාත් පෞද්ගලිකව විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, මේ වෙනුවෙන් අපට ගන්න පුළුවන් පියවරක් තමයි, මේ ආයතනවල ඉන්න නිලධාරීන් යම්කිසි කාල සීමාවකට යටත්ව මාරු කිරීම. ඒ ආයතනවල නම් කියන්න හොඳ නැහැ. උදාහරණයක් විධියට, ඒ ආයතනයේ ප්‍රධානියා ඇතුළු සුළු නිලධාරියා දක්වා යම් කාලයකට මාරු කරන්න ඕනෑ. එවැනි ක්‍රමවේදයකට මේ ආයතන පාලනය වෙනවා ද, එහෙම පාලනය කිරීමකට යටත් කිරීමට රජය සූදානම් ද කියලා මා අහන්න කැමැතියි. එහෙම කළේ නැත්නම්, ඔබතුමන්ලා කොපමණ උත්සාහ කළත් මේ තත්ත්වය පාලනය කරන්න බැහැ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවශ්‍ය වන්නේ, ඒ අයට දීර්ඝ කාලයක් එක තැනක ඉන්න දෙන්නේ නැතිව, කාලයෙන් කාලයට මාරු කරන්නද? [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔබතුමාගේ යෝජනාව- [බාධා කිරීමක්]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මගේ යෝජනාවක්.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ඒක බොහොම හොඳ යෝජනාවක්. අපි ඒ ගැන අවධානය යොමු කරලා, දැනටමත් ඒ කටයුතු කර ගෙන යනවා. එවැනි කරුණු තව තිබෙනවා නම් කිව්වොත්, ඒවා පිළිගන්න අපි ලෑස්තියි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

මේ කාරණය මාධ්‍යවල පළ වෙච්ච කාරණයක්. මේ කාරණය ඊයේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාත් මතු කළා. මේ ගරු සභාවේ සෞඛ්‍ය ඇමතිතුමියත් ඉන්නවා. මම මේ කියන්න යන කාරණය සෞඛ්‍යයට හිතකර ද, නැද්ද කියන්න දන්නේ නැහැ. ඔබතුමන්ලාගේ අමාත්‍ය මණ්ඩලයේ ඉන්න අමාත්‍යවරයෙක් ප්‍රකාශයක් කරනවා, ගංජා අපනයනය කිරීම තුළින් හොඳ අපනයන ආදායමක් ලබන්න පුළුවන් කියලා. ගංජා අපනයනය කිරීම තුළින් ආදායම් ලැබීම එතුමාගේ යෝජනාවක් ද? නැත්නම් එය කැබිනට් මණ්ඩලයේ යෝජනාවක් ද? එහෙමත් නැත්නම් පෞද්ගලිකව එතුමාගේ අදහසක් ද? අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මීට කලින් දවසක මේ ප්‍රශ්නය මතු කරලා අසා සිටියා, ගංජා විකුණලා ද මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න හදන්නේ කියලා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මම ලබා දීපු පිළිතුරුවලට නම් ඒ ප්‍රශ්නය අදාළ නැහැ. මා දීපු පිළිතුරෙන් මතුවන අතුරු ප්‍රශ්නයක් නොවෙයි ඔබතුමා අහන්නේ. මම දීපු පිළිතුර ගැන යම් පැහැදිලි කර ගැනීමක් වුවමනා නම් ඒ ගැන ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ඔබතුමා මතු කරපු ප්‍රශ්නයට මම පිළිතුරක් දෙන්නම්. ඒ ප්‍රශ්නය නැවත කෙටියෙන් අහන්න.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු ඇමතිවරයෙක් ප්‍රකාශයක් කරනවා, ගංජා නීති විරෝධී නැහැ කියන අදහස එන. එතුමා කියනවා, ගංජා කියන්නේ අපේ රටට අපනයන ආදායමක් උපයන්න පුළුවන් දෙයක් කියලා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ඒ ඇමතිවරයාගේ නම කියන්න බලන්න.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ඇමතිවරයාගේ නම කියන එක අසාධාරණයි නේද? එතුමා ඔබතුමන්ලාගේ ඉදිරිපෙළ අසුනක ඉන්න ඇමතිවරයෙක්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
වෙළෙඳ ඇමතිතුමා!

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
එතුමා වෙළෙඳ ඇමතිතුමා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මම හිතන හැටියට ඔබතුමා එම ප්‍රශ්නය වෙළෙඳ ඇමතිතුමාටම යොමු කළා නම් හොඳයි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ඔබතුමා එවැනි යෝජනාවකට අවසර දෙනවාද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මම නම් ඒකට ඉඩ දෙන්නේ නැහැ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අන්න ඒකයි මට දැනගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා ඒක කලින්ම ඇහුවා නම් ඉවරයි නේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ඒ ඇමතිවරයාගේ නම කියලාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නම කියලා හෝ වෙනත් විධියකට හෝ ඇහුවා නම් ඉවරයි නේ. -[බාධා කිරීමක්]- හරි, හරි. දැන් ඒ කථාව එතැනින් නවත්වන්න.

## මත්ද්‍රව්‍ය වැටලීම්: විස්තර
## போதைப்பொருள் சுற்றிவளைப்புக்கள்: விபரம்
## DRUG RAIDS: DETAILS

63/2020

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් සිදු කරන ලද නීති විරෝධී මත් ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම් මඟින් අත් අඩංගුවට ගත් නීති විරෝධී මත් ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එසේ අත් අඩංගුවට ගත් නීති විරෝධී මත්ද්‍රව්‍ය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය හරහා නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතට නැවත පත්වී ඇති බව එතුමා දන්නේද?

(ඇ) ඒ සම්බන්ධව ගනු ලබන ඉදිරි ක්‍රියා මාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்டவினா:

(அ) (i) 2015 ஆம் ஆண்டு தொடக்கம் இது வரை மேற்கொள்ளப்பட்ட சட்ட விரோத போதைப்பொருள் சுற்றிவளைப்புக்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அதன் மூலம், கைப்பற்றப்பட்ட சட்டவிரோத போதைப் பொருளின் அளவு எவ்வளவென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) அவ்வாறு கைப்பற்றப்பட்ட சட்டவிரோத போதைப் பொருள், பொலிஸ் போதைப்பொருள் தடுப்புப் பணியகத்தின் ஊடாக சட்டவிரோத போதைப்பொருள் வியாபாரத்தில் ஈடுபட்டுள்ளோர்களின் கைகளுக்கு மீண்டும் சென்றுள்ளதென்பதை அவர் அறிவாரா?

(இ) அது தொடர்பாக மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகளை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development & Housing:

(a) Will he inform this House -

(i) the number of illicit drug raids carried out since year 2015 to date; and

(ii) the amount of illicit drugs seized during aforesaid raids?

(b) Is he aware that the illicit drugs so raided had reverted back to drug smugglers through Police Narcotic Bureau?

(c) Will he also inform this House of the steps taken in that regard?

(d) If not, why?

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අසන ගමන් මම ඔබතුමාට මේකත් කියන්න ඕනෑ. ඔබතුමා තවමත් ඉන්නේ පුටුවේ අනෙක් පැත්තට බර වෙලායි. එහෙම කරන්න එපා. මේ ප්‍රශ්න අහන්න ඔබතුමා අපට උදව් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ පුටුව හරි කෙළින් තිබෙනවා. කොහේටවත් බර වෙලා නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඔබතුමා පිළිබඳ යම් විශ්වාසයක් අපට තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ නිසා තමයි ඔබතුමන්ලාට ඇති වෙන්න අවස්ථාව දීලා තිබෙන්නේ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2015.01.01 සිට 2020.09.18 දින දක්වා සිදු කරන ලද නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සම්බන්ධව වැටලීම් සංඛ්‍යාව 475,985කි. (හාරලක්ෂ හැත්තෑපන්දහස් නවසිය අසූපහයි)

(ii) එම වැටලීම් මඟින් අත් අඩංගුවට ගත් නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රමාණය කිලෝග්‍රෑම් හතළිස් හයදහස් අටසිය විසිහතරයි ග්‍රෑම් අටසිය දහහතයි. (46,824.817 kg)

(ආ) ඔව්.

වැටලීම්වලදී අත් අඩංගුවට ගෙන ඇති නීති විරෝධී මත්ද්‍රව්‍ය මුද්‍රා තබන ලද අවස්ථාවලදී අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍යවලින් යම් ප්‍රමාණයක් ඉවත් කර, එසේ ඉවත් කරන ගන්නා ලද ප්‍රමාණයට ආගන්තුක ද්‍රව්‍ය එක්කර, ඉවත් කර ගන්නා ලද මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් වෙත ලබා දී මුදල් උපයා ගෙන ඇති බවට කරුණු අනාවරණ වී ඇත.

(ඇ) ඔව්.

විමර්ශනවලදී අනාවරණ වූ කරුණු අනුව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයට අනුයුක්තව සේවය කරනු ලැබූ පොලිස් නිලධාරින් 18දෙනෙකු පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරින් එක් අයෙකු හා සිවිල් පුද්ගලයන් 06දෙනෙකු මේ සම්බන්ධව අත්අඩංගුවට ගෙන ඇත. එම පොලිස් නිලධාරින් අතුරින් 13දෙනෙකු රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. සෙසු පොලිස් නිලධාරින් 06ක් සහ සිවිල් පුද්ගලයන් 06ක් සම්බන්ධයෙන් රැඳවුම් නියෝග මත විමර්ශන කටයුතු සිදු කරගෙන යනු ලබයි. එහිදී, සැකකරුවන්ගෙන් අනාවරණ කර ගන්නා ලද තොරතුරු අනුව පහත සඳහන් දෑ අත් අඩංගුවට ගෙන ඇත.

1. T56 වර්ගයේ ගිනි අවි 02ක් සහ එම මැගසින් 05ක්
2. T56 වර්ගයේ ජීව උණ්ඩ 81ක්
3. පිස්තෝල 03ක් සහ 9mm වර්ගයේ ජීව උණ්ඩ 40ක්
4. හෙරොයින් කි.ග්‍රෑ. 11.888 මි.ග්‍රෑ.256ක්
5. ඉලෙක්ට්‍රොනික් තරාදි 02ක්
6. මුදල් රුපියල් 34,017,130.00ක්
7. රුපියල් 5,000 ව්‍යාජ නෝට්ටු 32ක්
8. කොකේන් මි.ග්‍රෑ. 380ක්

අත් අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයේදී මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගෙන ඇති රුපියල් 191,627,834.00ක් වටිනා වාහන සහ දේපළ තහනම් කිරීමට පියවර ගෙන ඇති අතර, මේ සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශන කටයුතු සිදුකරගෙන යනු ලබයි.

(ඈ) පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, ඔබතුමා හැම දාම පාර්ලිමේන්තුවට ඇවිල්ලා පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු අසන ප්‍රශ්නවලට උත්තර දෙනවා. ඒ පිළිබඳව ඇත්තටම අපි ඔබතුමාට ගෞරව කරනවා,

ගරු ඇමතිතුමනි, අපට තේරෙනවා, මේ ප්‍රශ්නයේදී අපටත් ඔබතුමන්ලාටත් නොපෙනුණු පැත්තක් තිබෙන බව. මේ නීති විරෝධී වැඩ පිළිවෙළට සම්බන්ධ රාජ්‍ය නිලධාරින් සිටිනවා. ඒ, විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සෘජුව සම්බන්ධ වන නිලධාරින්. මේ අනාවරණය සහ ඊට සම්බන්ධ වූ කණ්ඩායම්වලට දඬුවම් දීම ගැන අපි එක පැත්තකින් සතුටු වෙනවා.

අපි දන්නවා මේ සම්බන්ධයෙන් හාල් මැස්සන් තමයි විටින් විට ඇල්ලෙන්නේ කියලා. තෝරු මෝරු නිදැල්ලේ ඉන්නවා. තෝරු මෝරු අතරේ, විශේෂයෙන් දේශපාලන වශයෙන් සම්බන්ධ, නම ගිය, ප්‍රසිද්ධ, පාර්ලිමේන්තුව තුළත් සිටින කණ්ඩායම් ඉන්නවා. එක පැත්තකින් හොයාගෙන තිබෙනවා, අමාත්‍යාංශය සහ පොලීසිය හරහා ඇතැම් නිලධාරින් මේ කටයුත්ත කරනවා කියලා. ඒ කියන්නේ, අත් අඩංගුවට ගත් සමහර දේවල් උසාවියට ඉදිරිපත් කරලා, සීල් තබලා එළියට ගන්නකොට පිටි බවට පත් වනවා. පිටි බවට පත් වෙලා, ඒවා අතුරුදන් වෙලා නැවත සමාජයට මුදා හැරෙනවා. ඒක ඉතා ඛේදනීය තත්ත්වයක්. ඒවා මුදා හරින්නෙත් ප්‍රබල කණ්ඩායම්. ඒ ප්‍රබල කණ්ඩායම්වලට දේශපාලන බලවතුන්ගේ රැකවරණය තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම යෝජනාවක් කරනවා. ඔබතුමා ඇතුළු මේ ආණ්ඩුවට ඒ සියල්ල නවත්වා ගන්න පුළුවන් නම්, විශේෂයෙන්ම මත් කුඩු ඇතුළු මත්ද්‍රව්‍ය අපට සහමුලින්ම මේ රටින් තුරන් කරන්න පුළුවන්. ඒ සඳහා යම් සාධනීය වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය ආරම්භ කරලා තිබෙනවාද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර මේ කටයුතු සියල්ලම Police Narcotics Bureau එකේ සිටි නිලධාරින් තනිවම තමයි කළේ. ඒ අය මත්ද්‍රව්‍ය අල්ලනවා, උසාවියට produce කරනවා; ඒ සියලු දේවල් කළා. දැන් Police Narcotics Bureau එකට අමතරව, පොලීසියේ බුද්ධි අංශය, STF එක සහ අපරාධ විමර්ශන අංශය - CID - කියන සියලු අංශ එකතු වෙලා මේ පරීක්ෂණ හා විමර්ශනවලදී ඒ සොයා බැලීමේ කටයුතු කරනවා. එතකොට මේ තත්ත්වය පුළුවන් තරම් අවම කර ගන්න අපට පුළුවන් වෙයි. යම් කෙනෙක් වරදක් කරනවා නම්, ඒක නතර කර ගන්න පුළුවන් වෙයි. දැන් ඒ සියලු අංශ එකට එකතු කරලා තිබෙන්නේ. එතකොට, ඔබතුමා කිව්වා වාගේ, අවුරුදු ගණන් එක තැන ඉඳගෙන ඒ සමහර අයට මේවාට සම්බන්ධ වෙන්න බැරි වනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, එක පාර්ශ්වයක් ගැන හොඳ නිරීක්ෂණයක් තිබෙන බව ඇත්තටම පෙනී යනවා. නමුත්, මේකට දේශපාලන වශයෙන් මැදිහත් වන හා සම්බන්ධ වන පාර්ශ්ව සඳහා වැඩ පිළිවෙළක් නැහැ.

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අපි නිතර මාධ්‍ය තුළින් මේ මත්ද්‍රව්‍ය වැටලීම් දකිනවා. ඒ වාගේම ඒ මත්ද්‍රව්‍ය, මත්ද්‍රව්‍ය නොවී පිටි බවට පත්වෙමින් නැවත වතාවක් සමාජයට එකතු වෙනවා. නමුත්, මේ මත්ද්‍රව්‍ය අල්ලනවා හැරෙන්න, මේවා මර්දනය සඳහා සාධනීය විසඳුමක්, ප්‍රධාන පෙළේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ආකාරයක් අපි දකින්නේ නැහැ. හෙලිකොප්ටර් මඟින් ගිහිල්ලා වැටලීම් කරනවාත් අපි දැක්කා. විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ගංජා හේන් අල්ලනවා. මම පළමුවන අතුරු ප්‍රශ්නයෙන් ඇහුවේත් ඒ කාරණය ගැනයි. නමුත්, මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදී සිටින ප්‍රධාන පෙළේ කණ්ඩායම් මෙන්න මේ අය කියලා හඳුනාගෙන තිබෙනවාද? ඒ සඳහා යම් හෝඩුවාවක් තිබෙනවාද? ඒ හෝඩුවා අතර, ඉතා ඉක්මනින් මේ කටයුත්ත අවසන් කරන දින වකවානු සම්බන්ධයෙන් යම් කාලානුරූපී වැඩ සටහනක් අමාත්‍යාංශය විසින් ආරම්භ කරලා තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

අදාළ අමාත්‍යාංශය යටතේ පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව සක්‍රිය ලෙස මේ සඳහා යොදවා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඔය කුඩු, පිටි වෙනවා; අරක්කු, වතුර වෙනවා. ඒ දේවල් අල්ලා දෙන්නේ

[ගරු චමල් රාජපක්ෂ මහතා ]

පොලීසියෙන් හෝ සුරාබදු දෙපාර්තමේන්තුවෙන් තමයි. Government Analystගෙන් තමයි ඊළඟට ඒවා උසාවියට ඉදිරිපත් වන්නේ. මම හිතන හැටියට ඒ දෙපාර්තමේන්තුවේත් කිහිප දෙනෙක් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. මහා පරිමාණයෙන් මත්ද්‍රව්‍ය ජාවාරම් කරන විශාල පිරිසක් දැනට රිමාන්ඩ් භාරයේ සිටිනවා. තවත් අය හඳුනාගෙනත් තිබෙනවා, අල්ලා ගන්නට නියමිතවත් තිබෙනවා. ඒ පුද්ගලයන් සම්බන්ධ තොරතුරු ලබාගන්න ජනතාවගේ සහයෝගය අවශ්‍ය වෙනවා. මේ මත් කුඩු බෝට්ටු හරහා මුහුදෙන් ගෙන එනවා නම්, ඒ බෝට්ටු එන තැන් ආවරණය කරන්නත් දැන් ලංකාව වටේම ත්‍රිවිධ හමුදාව යොදවා තිබෙනවා. මහා පරිමාණයෙන් ලංකාවට එන මත්ද්‍රව්‍ය ප්‍රමාණ පිළිබඳව ඉදිරියේදී අපට යම් පාලනයක් ඇති කර ගන්න පුළුවන් වෙයි. ඔබතුමාට මේ සම්බන්ධයෙන් දැනුවත්භාවයක් තිබෙන බව මට තේරෙනවා. ඔබතුමාට පුළුවන්, ඒ තොරතුරු රහසිගතව අපට ලබා දීලා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු ඇමතිතුමාගෙන් මාත් පොඩි ප්‍රශ්නයක් අහන්නම්, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, අත්අඩංගුවට ගන්නා ප්‍රමාණය දවස ගණනේ වාර්තා කළ යුතුයි. ඔබතුමා කියනවා වාගේ, කුඩු අල්ලලා රස පරීක්ෂක වෙත යවනවා. ඊට පස්සේ, ඒ තිබෙන ප්‍රමාණයට මොනවා වෙනවාද දන්නේ නැහැ. ඒ ප්‍රමාණය පාර්සල් කිරීමක් හෝ පාන් පිටි බවට පත් වීමක් හෝ වෙන මොනවා හෝ වෙනවා. මේ ගැන සමාජයේ තිබෙන ලොකුම සැකය තමයි, අත් අඩංගුවට ගන්නා ඒ කුඩු හෝ මත්ද්‍රව්‍ය වෙනත් විධියකින් නැවත සමාජගත වෙනවාය කියන එක. පසුගිය දවස්වල සිදුවුණු දේවල්වලින් ඒ විධියට සැක කරනවා.

මම අහන ප්‍රශ්නය මේකයි. මේවා අත්අඩංගුවට ගත්තාට පසුව යම් ආකාරයක සහතික කර ගැනීමකින් අනතුරුව - අධිකරණයෙන් හෝ රස පරීක්ෂකගෙන් හෝ සහතික කර ගත්තාට පසුව- නඩු භාණ්ඩ වශයෙන් තබා නොගෙන සමාජයට පෙනෙන්න වහාම විනාශ කරන විධියේ යම් වැඩ පිළිවෙළක් හදන්න බැරිද, ගරු ඇමතිතුමනි? "මෙපමණ ප්‍රමාණයක් අපි අත්අඩංගුවට ගත්තා, ඒ ප්‍රමාණය විනාශ කළා" කියලා කාටත් පෙනෙන්න ඒ දෙය කරන්න ඕනෑ. නැත්නම් සිද්ධ වෙන්නේ මොකක්ද? කිලෝ 100ක් ඇල්ලුවා කියනවා. සතියකට පසුව තවත් කිලෝ 200ක් ඇල්ලුවා කියනවා. එතකොට මිනිස්සු හිතනවා එකම තොගය තමයි මේ එන්නේ කියලා. නීත්‍යානුකූලව සහතික කර ගත්තාට පසුව, කෙටි දවසකින් මේවා සමාජයට පෙනෙන්න විනාශ කරලා දැම්මා නම් මිනිසුන් ඒ සැකය තියා ගන්නේ නැහැ. ඒ යෝජනාව මා ඔබතුමාට කරන්න කැමැතියි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු කථානායකතුමනි, එතුමා ඇසූ තුන්වැනි අතුරු ප්‍රශ්නය බොහොම හොඳයි.

අපි ඒ පිළිබඳව දැන් අවධානය යොමු කර තිබෙනවා. එක් අංශයක් විසින් මේ මත් ද්‍රව්‍ය අත් අඩංගුවට ගන්න කොට, නැවත එවැනි දේවල් සිදු නොවෙන්න තමයි, CID එකේ, බුද්ධි අංශයේ, STF එකේ නිලධාරිනුත් ඒ වෙනුවෙන් යොදවා තිබෙන්නේ. ඒ අල්ලා ගත් ප්‍රමාණය කොපමණද බලන්නත්, ඒවා සීල් කිරීම සහ එක් එක්කෙනාගේ සාක්කුවලට යෑම නතර කිරීමටත් තමයි මේ පියවර අරගෙන තිබෙන්නේ.

අනික් කාරණය මේකයි. නඩුවකදී උසාවියට භාණ්ඩ produce කරනකොට ඒ භාණ්ඩවල යම්කිසි ප්‍රමාණයක් තිබෙනවා නේ. ඉතිරි ටික විනාශ කරන්න පුළුවන්ද කියන කාරණය ගැන සොයා බැලීම අධිකරණ ඇමතිතුමාට පවරලා, ඒ සඳහා ක්‍රමවේදයක් සොයන්න ඕනෑ. ඒවා ගිනි තියන්න දුන්නොත් සමහර වෙලාවට එතැනින්ම සමහර ඒවා එළියට යන්න පුළුවන්. ඒ නිසා ඒ සඳහා ක්‍රමවේදයක් හදනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -105/2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -166/2020- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - காணி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Lands)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් තොරතුරු රාශියක් ගන්න තිබෙනවා. ඒ නිසා මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, විස්තර ලබා ගැනීමට තිබෙන නිසා ඇමතිතුමා ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලුවා. මා ළඟ විස්තර තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම් මට ඒ විස්තර ලබා දෙන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. [බාධා කිරීමක්] ඔප්පු නැති ඒවා පිළිබඳ විස්තර තමයි මා ළඟ තිබෙන්නේ. මම ඔබතුමාගෙන් අහන්න බලාපොරොත්තු වුණේ ඔප්පු ලබා දෙන්නේ කවදාද කියලායි. ඔප්පු නැති ගෙවල් සම්බන්ධ ඒ ප්‍රදේශවාසීන්ගේ විස්තර මා ළඟ තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, එතුමා නිල වශයෙන් විස්තර අරගෙන එපා යැ, කියන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මම වැරදි දෙයක් නොවෙයි කිව්වේ. මගේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ ඔප්පු ලබා දෙන්නේ කවදාද කියලා නේ. ඒ පිළිබඳව විස්තර හොයන්න තිබෙනවා නම් මගේ ළඟත් කොට්ඨාස වශයෙන් කට්ටි හතරක විස්තර තිබෙනවා. ඒ, කට්ටි සැලසුම් තිබෙන ඒවා, නැති ඒවා, ඔප්පු දුන්නු ඒවා, කොටස් වශයෙන් ඉතිරි වෙලා තිබෙන ඒවා වශයෙන් මා ළඟ විස්තර තිබෙනවා. ඔබතුමාට කරන උදව්වක් විධියට ඒ විස්තර ටික මට ලබා දෙන්න පුළුවන් බවයි මම කියන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඒ විස්තර ටිකත් ඔබතුමා මට දෙන්න. මම ඒ ගැන බලලා, සති දෙකෙන් හරියට උත්තරය දෙන්නම්.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කිළි/කිළිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලය: අඩුපාඩු
## கிளி/கிளிநொச்சி மத்திய மகா வித்தியாலயம்: குறைபாடுகள்
KILI/ KILINOCHCHI CENTRAL COLLEGE: SHORTCOMINGS

187/2020

**5. ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිළි / කිළිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලය නමැති පාසලක් පවතින බවත්;

(ii) කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් දෙකෙන් එකක් වූ ඉහත විද්‍යාලයෙහි පහළ අධ්‍යාපන තත්ත්වයක්, ගුරු / සේවක පුරප්පාඩු, ගෘහභාණ්ඩ / ගොඩනැගිලි සහ සම්පත් හිඟකම් ඇතුළු අඩුපාඩු රාශියක් පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) මෙම පාසලට අවශ්‍ය ගොඩනැගිලි සහ ගෘහභාණ්ඩ ලබා දෙන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) ඉහත විද්‍යාලයෙහි විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, ගුරු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ එක් එක් තනතුරුවල විස්තර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) ඉහත විද්‍යාලයෙහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතියද, මේ දක්වා එකී පුරප්පාඩු පිරවීම සඳහා පියවර නොගැනීමට හේතුව කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) උක්ත පුරප්පාඩු පිරවීමකින් තොරව සිසුන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කළ නොහැකි බව එතුමා පිළිගන්නේද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தின் கரைச்சி பிரதேச செயலகப் பிரிவில் கிளி/கிளிநொச்சி மத்திய மகா வித்தியாலயம் என்ற பெயரில் பாடசாலையொன்று உள்ளது என்பதையும்;

(ii) கிளிநொச்சி மாவட்டத்திலுள்ள தேசிய பாடசாலைகள் இரண்டில் ஒன்றான மேற்படி பாடசாலையில் தரம் குறைவான கல்வி, ஆசிரியர்கள்/ஊழியர்கள் பற்றாக்குறை, தளபாடங்கள்/கட்டடங்கள் பற்றாக்குறை, வளப் பற்றாக்குறை உட்பட பல குறைபாடுகள் காணப்படுகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலைக்குத் தேவையான கட்டிடங்கள் மற்றும் தளபாடங்களை பெற்றுக்கொடுக்கும் திகதி யாதென்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) மேற்படி வித்தியாலயத்தின் அதிபர், பிரதி அதிபர், ஆசிரியர் மற்றும் கல்விசாரா ஊழியர்கள் உட்பட மொத்தப் பணியாட்தொகுதியிலும் ஒவ்வொரு பதவிகளின் விபரங்கள் யாவை என்பதையும் அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இப்பாடசாலையில் கல்விசாரா பணியாட்தொகுதியில் வெற்றிடங்கள் காணப்பட்ட போதிலும், இற்றைவரையில் இவ்வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை மேற்கொள்ளாமைக்கான காரணங்கள் யாவை என்பதையும் அவர் இச்சபையில் அறிவிப்பாரா?

(உ) குறித்த வெற்றிடங்களை நிரப்பாது மாணவர்களின் கல்வி நடவடிக்கைகளை மேம்படுத்த முடியாதென் பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஊ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) there is a school by the name of Kili/ Kilinochchi Central College in the Karachchi Divisional Secretary's Division of Kilinochchi District; and

(ii) there are a number of shortcomings including the poor standards of education, dearth of teachers/workers, scarcity of furniture/ buildings and resources in the above school, which is one of the two National Schools in the District of Kilinochchi?

(b) Will he inform this House as to when this school will be provided with the required buildings and furniture?

(c) Will he also inform this House of the particulars related to each of the positions of the entire staff of the above school including the Principal, Deputy Principal, teachers and the non-academic staff?

(d) Will he further inform this House of the reasons for not hitherto taking steps to fill the vacancies that exist in the non-academic staff of the above school?

[ගරු සිවඥානම් සිරීතරන් මහතා]

(e) Will he admit the fact that the educational activities of the students cannot be enhanced without filling the above vacancies?

(f) If not, why?

**ගරු ජී.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා - (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් සිටී.

(ආ) ඔව්.

2019 වර්ෂයේදී ද්විතියික අංශයේ ගුණාත්මක යෙදවුම් සඳහා රු.52,000.00ක මුදලක් ලබා දී ඇති අතර, 2020 වර්ෂය සඳහා මෙම විද්‍යාලයට පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන යටතේ රුපියල් ලක්ෂයක් ලබා දී ඇත.

මූලික කටයුතු ආරම්භ කර ඇති ශ්‍රවණාගාරයේ සහ ආපන ශාලාවේ ඉදිකිරීම් කටයුතු ජාතික අය වැය චක්‍රලේඛ අංක 05/2020 මඟින් පනවා ඇති සීමා ඉවත් කළ වහාම ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ඔව්.

ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

එම ඇමුණුම ගරු මන්ත්‍රීතුමාටත් ලබා දෙන්නම්.

(ඈ) වාර්ෂික ස්ථාන මාරුවීම්වලින් සහ නව බඳවා ගැනීම්වලින් අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

(ඉ) පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් සිටී.

(ඊ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
** Annex tabled:*

<u>**කිළි/කිළිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු**</u>

| තනතුරු නාමය | සේවය (දැනට සේවයේ යෙදී සිටින නිලධාරින්ගේ සේවය) | අනුමත තනතුරු ගණන | සේවයේ යෙදී සිටින ගණන | පුරප්පාඩු ගණන |
|---|---|---|---|---|
| විදුහල්පති | ශ්‍රී ලංකා විදුහල්පති සේවය 2 | 01 | 01 | 0 |
| නියෝජ්‍ය විදුහල්පති | ශ්‍රී ලංකා විදුහල්පති සේවය | 01 | 01 | 0 |
| සහකාර විදුහල්පති | ශ්‍රී ලංකා විදුහල්පති සේවය | 02 | 02 | 0 |
| උපගුරු | ශ්‍රී ලංකා ගුරු සේවය | 68 | 77 | 0 |
| සංවර්ධන නිලධාරී/ කළමනාකරන සේවා නිලධාරී | ආශ්‍රිත නිලධාරී / කළමනාකරණ සේවා නිලධාරී සේවය | 05 | 01 | 04 |
| ශිෂ්‍ය නිවාස අධිකාරී | | 02 | 0 | 02 |
| ක්‍රීඩා උපදේශක | | 01 | 01 | 0 |
| පාසල් කම්කරු | | 06 | 03 | 03 |
| පුස්තකාල සහායක | | 02 | 0 | 02 |
| රසායනාගාර සහායක | ප්‍රාථමික ශිල්පීය නොවන | 04 | 0 | 04 |
| තාක්ෂණික රසායනාගාර සහායක | | 02 | 01 | 01 |
| අරක්කැමි | | 02 | 0 | 02 |
| මුරකරු | | 05 | 03 | 02 |
| සනීපාරක්ෂක කම්කරු | | 04 | 02 | 02 |

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, கிளிநொச்சி மாவட்டத்தின் நகரப் பகுதியிலே இருக்கின்ற கிளிநொச்சி மத்திய மகா வித்தியாலயமானது அம்மாவட்டத்தின் ஒரு தாய்ப் பாடசாலைகும். இது ஒரு தேசியப் பாடசாலையாகும். கிட்டத்தட்ட 2,000 மாணவர்கள் கல்வி கற்கின்ற ஒரு தேசியப் பாடசாலைக்கு 50,000 ரூபாய், 100,000 ரூபாய் என பணம் ஒதுக்கப்பட்டிருக்கின்றதென்றால், அந்தப் பணத்தை வைத்துக்கொண்டு அந்தப் பாடசாலையினுடைய எந்தத் தேவையைப் பூர்த்திசெய்ய முடியும்? அங்கு தேவையாக இருக்கின்ற ஆளணியினர் தொடர்பாக நீங்கள் சரியான பதிலைச் சொல்லவில்லை. 'ஆம்', 'இல்லை' என்ற பதிலோடு முடிக்கிறீர்கள்.

**ගරු ජී.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අහන්න.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, சிற்றூழியர் நியமனம் கேட்கின்றேன். அவர்கள் காரியாலய உதவியாளர்களாக இருக்கலாம்! உங்களுடைய விடை திருப்தியளிக்கவில்லை. 50,000 ரூபாய், 100,000 ரூபாய் என்ற நிதியொதுக்கீடானது அந்தப் பாடசாலைக்குப் பொருத்தமற்றது. அங்கே 17 சிற்றூழியர்களுக்கான வெற்றிடங்கள் இருக்கின்றன. அந்த வெற்றிடங்கள் எப்பொழுது நிரப்பப்படும்?

**ගරු ජී.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

You have not asked that in the Question. You referred to some funds. Now, you are talking about the non-academic staff. There are two questions. Sir, I just want to know what his question is.- [*Interruption.*]

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒழுங்குப் பத்திரத்திலேயிருக்கின்ற 'ஈ' கேள்வியைப் பாருங்கள்!. "இப்பாடசாலையில் கல்விசாரா பணியாட் தொகுதியில் வெற்றிடங்கள் காணப்பட்டபோதிலும், இற்றைவரையில் இவ்வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை மேற்கொள்ளாமைக்கான காரணங்கள் யாவை?" என்ற கேள்வி இங்கே கேட்கப்பட்டிருக்கிறது. அப்படியான கேள்வி கேட்கப்படவில்லையென்று நீங்கள் கூறுகின்றீர்கள். அந்த வெற்றிடங்கள் ஏன், நிரப்பப்படவில்லை என்றுதான் நான் உங்களைக் கேட்கின்றேன். அதற்கு நீங்கள் விடை தரவில்லையே!

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
I will answer that question.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
இதற்கு நீங்கள் சரியான விடை தரவில்லையே!

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
You do not allow me to answer. You are giving me a lecture.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
அப்படியென்றால், பதிலைச் சொல்லுங்கள்!

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
Is that okay? You finish asking your two Supplementary Questions.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒழுங்குப் பத்திரத்திலே இருக்கின்ற 'ஈ' கேள்விக்கு என்ன விடை?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
Okay. Now, listen to me. මම සිංහලෙන් කියන්නම්, interpretation එක ලැබෙයි.

කිළිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසලක් තමයි. එහි අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලවල අනුමත තනතුරු ගණන සහ පුරප්පාඩු ගණන ගත් විට අධ්‍යයන සේවකයන්ගේ පුරප්පාඩු නැහැ. ගුරුවරු 7ක් අතිරික්තයි. හැබැයි, ඒ ගුරුවරු විෂයන්වලට නොගැළපෙන්න පුළුවන්. නමුත්, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබෙනවා. ශිෂ්‍ය නිවාස අධිකාරි කියන තනතුරේ පුරප්පාඩු 2ක් තිබෙනවා. ක්‍රීඩා උපදේශක ඉන්නවා. පාසල් කම්කරුවන් තුන් දෙනෙක් ඉන්නවා. තව තුන් දෙනෙක් මදි. පුස්තකාල සහායක පුරප්පාඩු 2ක් තිබෙනවා. රසායනාගාර සහායකයන් හතර දෙනෙක් අවශ්‍යයි, තාක්ෂණික රසායනාගාර සහායකයන් එක් අයෙක් අවශ්‍යයි, අරක්කැමියන් දෙන්නෙක් අවශ්‍යයි, මුරකරුවන් දෙන්නෙක් අවශ්‍යයි, සනීපාරක්ෂක කම්කරුවන් දෙන්නෙක් අවශ්‍යයි. ඒ ටික අපි පිළිගන්නවා. ඒ විස්තර ටික මේ ලේඛනයේ තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා මට ඒ උත්තරය දෙන්න ඉඩ දුන්නේ නැහැ නේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය යටතේ විදුහල්පතිවරු ඉන්නවා; ගුරුවරු ඉන්නවා; අතිරික්ත ගුරුවරු හත් දෙනෙකුත් ඉන්නවා.

ප්‍රතිපාදන ගැන කියනවා නම් රුපියල් මිලියන 68ක වියදමින් තෙමහල් පන්ති කාමර ගොඩනැඟිල්ලක් සහ විදුහල්පති නිල නිවාස නව ඉදිකිරීම් ලෙසත්, සුහුරු පන්ති කාමර සඳහා ගොඩනැඟිලි අලුත්වැඩියාවත්, අබලන් ගොඩනැඟිලි අලුත්වැඩියාවත් සිදුකොට තිබෙනවා. ඉතිරි ටිකට මේ අවුරුද්දේ ප්‍රාග්ධන යෙදවුම් වෙන් කළේ නැහැ. මොකද, මේ අවුරුද්දේ තිබුණේ අතුරු සම්මත ගිණුමක්නේ. ප්‍රාග්ධන යෙදවුම් යොදා ඊ ළඟ අය වැයේදී ඉතිරි ටික කර ගෙන යනවා.

මේ පාසලට විතරක් නොවෙයි, ලංකාවේ හැම පාසලකටම මේ අවුරුද්දේ ප්‍රාග්ධන යෙදවුම් යෙදුණේ නැහැ. මොකද හේතුව, පඩිනඩි ගෙවීම සඳහා පුනරාවර්තන වියදම්වලට පමණයි අතුරු සම්මත ගිණුමෙන් මුදල් ලැබුණේ.

වාර්ෂික ස්ථානමාරුවීම් අනුව ඉදිරියේදී අනධ්‍යයන සේවකයන් එම පාසලට ලබා දෙනවා.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, கிளிநொச்சி மாவட்டத்திலேயிருக்கின்ற தாய்ப்பாடசாலையான இந்தத் தேசியப் பாடசாலைக்குத் தேவையான கல்விசாரா ஊழியர்களுக்கான வெற்றிடங்கள் நிரப்பப்படுமா? அதற்கு ஏதாவது வாய்ப்பு இனிமேல் வருமா?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
ගරු මන්ත්‍රීතුමනි, පුරප්පාඩු පුරවනවා. වාර්ෂික ස්ථානමාරුවීම් අනුව ඒ පුරප්පාඩු පුරවන්න ඕනෑ. කොවිඩ් - 19 වසංගතය නිසා මාස පහක කාලයක් පාසල් වසා තිබුණා. ඒ නිසා ස්ථානමාරු ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ පාසලට මාරුකර එවන අයගෙන් වැඩි පිරිසක් එවන්න වෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්. මොකද, ලංකාවේ පාසල්වලට අනුයුක්ත කළ අනධ්‍යයන සේවකයන්ගෙන් සියයට 80ක්, 90ක් ඉන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අය. අපට ඒ අය කිළිනොච්චියට පහසුවෙන් එවන්න පුළුවන්. අපි ඒ අය එවන්නම්.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, கிளிநொச்சியிலே இருக்கின்ற ஒரு பாடசாலைக்குக் குருநாகலிலிருந்தான் ஊழியர்கள் வரவேண்டும் என்று அமைச்சர் சொல்கிறாரென் றால், கிளிநொச்சியில் இருக்கின்றவர்களுக்கு என்ன வேலை?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
මම කිව්වේ ඒක නොවෙයි. ඔබතුමා තේරුම් ගන්න. මේ සේවක සංඛ්‍යාව සම්පූර්ණ කරලායි තිබෙන්නේ. පසුගිය පාලන කාලයේදී සේවකයන් සියලුදෙනාම බඳවා ගෙනයි තිබෙන්නේ.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, எனக்குப் பேச நேரம் தாருங்கள்!

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

අහගන්න. ඔබතුමාට ඊළඟ ප්‍රශ්නය අහන්න කලින් මම මේ ප්‍රශ්නයට උත්තර දෙන්න එපා යැ. නැත්නම් ඒක අහන්න බැහැ නේ.

එයින් සියයට 80ක් විතර හිටියේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අය. මම කිව්වේ නැහැ, කුරුණෑගල අය එවනවා කියලා. සියයට 80ක් විතර කුරුණෑගල අය ඉන්නවා කියන එකයි මම කිව්වේ. ඔබතුමන්ලාගේ ප්‍රදේශයට දමිළ අනධ්‍යයන සේවකයන් අනෙක් ප්‍රදේශවලින් එවනවා. අපට ඉඩ දෙන්න, වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී ඒක කරන්න.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, இடமாற்றத்தில் அனுப்பி வைப்பதாக நீங்கள் சொல்கின்றீர்கள். இடமாற்றத்தில் அங்கு வருவதென்றால், எங்கேயிருந்து வருவார்கள்? தென்பகுதியிலிருந்து வருவதென்றால், அவர்கள் சிங்களமொழி பேசுபவர்களாகத்தான் இருப்பார்கள்! 100 சதவீத தமிழ் மாணவர்கள் கல்வி கற்கின்ற அந்தப் பாடசாலையில் -

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

මම කිව්වේ, දමිළ භාෂාව කථා කරන අය තමයි එවන්නේ කියලා.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

யுத்தத்தால் பாதிக்கப்பட்ட மாவட்டம் என்ற வகையிலே, அந்த நியமனங்களை வழங்குகின்ற விடயத்திலாவது, அந்த மாவட்டத்திலே இருக்கின்றவர்களுக்கு நீங்கள் ஏன், முன்னுரிமை கொடுக்கக் கூடாது?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

ඒක ඔබතුමාට අහන්න තිබුණේ ඒ කාලයේ. ඒ කාලයේ සම්පූර්ණයෙන් පුරවන කොටයි අහන්න තිබුණේ, "ඇයි,

කුරුණෑගලින් විතරක් දමන්නේ" කියලා. අපි හරියට ඒක කරන්නම්.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, 'அந்தக் காலம்', 'இந்தக் காலம்' என்று நீங்கள் சாட்டுச் சொல்லக் கூடாது. இப்பொழுது நீங்கள்தான் கல்வி அமைச்சராக இருக்கின்றீர்கள். நீதியின் அடிப்படையில் நியமனம் வழங்குவதற்கு நீங்கள் தயாராக வேண்டும்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නයට විනාඩි 10ක් ගත්තා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි මා කිව්වේ, දමිළ භාෂාව කථා කරන අනධ්‍යයන සේවකයෙකු එවන්නම් කියලා. පාසල් වහලා නේ මේ දවස්වල.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මට අවස්ථාවක් දෙන්න. අනිද්දා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගය ගැන මට ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මොකක්ද ප්‍රශ්නය?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ප්‍රශ්නය, ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින ගම්පහ දිස්ත්‍රික්කයේ ළමයින් සම්බන්ධවයි. ඒ අය ඉන්නේ ගම්පහ වුණත් ඉගෙන ගන්නේ කොළඹ. [බාධා කිරීම්]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

අවශ්‍ය පහසුකම් දෙනවා, ඒ දරුවන් සුපුරුදු මධ්‍යස්ථානවලටම රැගෙන යන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ ළමයි ජීවත් වන්නේ ගම්පහ. ඉස්කෝලේ - [බාධා කිරීම්] Do not disturb me. I am asking a question.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

හරි හරි, ගරු මන්ත්‍රීතුමනි. දැනුත් ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ සාකච්ඡාවක් පැවැත්වෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ ළමයින් ජීවත් වන්නේ ගම්පහ. ඔවුන් පාඩම් කරන්නේ කොළඹ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

පාඩම් කරන්නේ කොළඹ නොවෙයි. පාඩම් කරන්නේත් ගම්පහ. ඔවුන් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින්නේ කොළඹ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පාසල්වල ළමයින් නැවතිලා ඉන්නවා නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

හරි හරි, මන්ත්‍රීතුමා. ළමයි 800ක් ඉන්නවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ විදුහල්පතිවරු ඒ ළමයින්ට නොකියා කියනවා, එන්න එපා කියලා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ නැහැ, මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Telephone කරලා කියනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම ඔබතුමාට කියනවා, මේ වෙලාවේත් සෞඛ්‍ය බලධාරින්, පොලීසිය, ප්‍රවාහන නිලධාරින් ඇතුළු සියලුදෙනා සමඟ අමාත්‍යාංශ ලේකම්වරයා සාකච්ඡාවක් පවත්වන බව. එවැනි දුෂ්කරතා තිබෙන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ දරුවන්ට විතරයි. ඒ ගොල්ලන්ට අසාධාරණයක් නොවන ආකාරයට ඒ ප්‍රශ්නය විසඳන්න දැන් සාකච්ඡා කරගෙන යනවා. එතකොට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ ළමයින්ට ගම්පහ දිස්ත්‍රික්කයේදි විභාගයට පෙනී සිටින්න අවස්ථාවක් ලබා දෙන්න පුළුවන්ද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
දැන් ඒ ගැන සාකච්ඡා කරගෙන යනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
All right.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Shritharan, you have already taken ten minutes for this Question.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, தயவுசெய்து கேளுங்கள்! இலங்கையிலே கிளிநொச்சி மாவட்டமானது கல்வியிலே மிகவும் பின்தங்கிய ஒரு மாவட்டமாகும். அந்த அடிப்படையில், இந்த மாவட்டத்தின் தேவைகளைப் பூர்த்தி செய்வதில் உரிய அக்கறை காட்டப்படவில்லை. அந்த மாவட்டத்தினுடைய கல்வி நிலை தொடர்பாக உங்களுடைய செயற்பாடுகளை முடுக்கிவிட வேண்டுமென்று நான் இந்த இடத்தில் தாழ்மையாகக் கேட்டுக் கொள்கின்றேன். கடந்த காலத்தைப் பற்றிக் கதைத்துக்கொண்டிருக்காமல், இனிவரும் காலங்களில் என்ன செய்ய முடியுமென்பதைத் தெளிவாகச் சொல்லுங்கள்!

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියට කරන දේ තමයි මා කිව්වේ. පාසල් ආරම්භ වන කොට, වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ දමිළ භාෂාව කථා කරන අනධ්‍යයන සේවකයන් ඒ පාසලටත් ලබා දෙනවා. ඒ පාසල ගැන මා දන්නවා. ඒ ප්‍රදේශයට මා ගිහිල්ලාත් තිබෙනවා. කිළිනොච්චියේ තිබෙන ජාතික පාසල් දෙකෙන් එකක් තමයි ඒ පාසල.

## මන්නාරම, SLIATE ආයතනය: ස්ථිර ගොඩනැඟිල්ලක්
### மன்னார் SLIATE நிறுவனம்: நிரந்தரக் கட்டிடம்
### SLIATE IN MANNAR: PERMANENT BUILDING

207/2020

**6. ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති SLIATE ආයතනයේ Higher National Diploma පාඨමාලා ආරම්භ කර අවුරුදු 03ක් ගත වී තිබුණද තවමත් තාවකාලික ගොඩනැඟිල්ලක එම ආයතනය පවත්වාගෙන යන බව එතුමා දන්නේද?

(ආ) (i) ඒ හේතුවෙන් Information Technology, English, Tourism වැනි පාඨමාලා පමණක් පවත්වන බවත්;

(ii) පාඨමාලා සඳහා අවශ්‍ය පරීක්ෂණාගාර පහසුකම් නොමැති බව; සහ

(iii) Accounting, Management යනාදි පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි බවත්; එතුමා පිළිගන්නේද?

(ඇ) SLIATE ආයතනයට ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදි කිරීම සඳහා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උයිලංකුලම් ප්‍රදේශයේ අක්කර 05ක ඉඩමක් එවක උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දී වසරකටත් වඩා ගත වී ඇති බවත් එතුමා දන්නේද?

(ඈ) මන්නාරමේ ඉදි කිරීමට නියමිත SLIATE ආයතනයේ ස්ථිර ගොඩනැඟිල්ල ලෝක බැංකුවේ දායකත්වයෙන් ආරම්භ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක්ම පැවැත්වුණු අතර ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ වන්නේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்டவினா:

(அ) மன்னார் மாவட்டத்தில் அமைந்துள்ள கல்வி அமைச்சின்கீழ் வரும் SLIATE நிறுவனத்தில் Higher National Diploma கற்கை நெறிகளை ஆரம்பித்து 03 வருடங்கள் கடந்த போதிலும், இது வரை தற்காலிகக் கட்டிடம் ஒன்றிலே அந்நிறுவனம் இயங்குகின்ற தென்பதை அவர் அறிவாரா?

[ගරු චාල්ස් නිර්මලනාදන් මහතා]

(ஆ) (i) அதன் காரணமாக, Information Technology, English, Tourism ஆகிய கற்கை நெறிகள் மாத்திரம் நடாத்தப்படுகின்றன என்பதையும்;

(ii) கற்கை நெறிகளுக்கு அவசியமான ஆய்வுகூட வசதிகள் இல்லையென்பதையும்;

(iii) Accounting, Management ஆகிய கற்கை நெறி களை ஆரம்பிக்க முடியாதுள்ளது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) SLIATE நிறுவனத்திற்கு நிரந்தர கட்டிடமொன்றை நிர்மாணிப்பதற்கு மன்னார் மாவட்ட செயலகத்தினால் மன்னார் பிரதேச செயலகப் பிரிவிற்குரிய உயிலங்குளம் பிரதேசத்தில் 05 ஏக்கர் அளவுடைய காணியொன்று அப்போதைய உயர் கல்வி அமைச்சுக்கு வழங்கப்பட்டு ஒரு வருடத்திற்கும் மேலாகின்றது என்பதையும் அவர் அறிவாரா?

(ஈ) மன்னாரில் நிர்மாணிக்கப்படவுள்ள SLIATE நிறுவனத்தின் நிரந்தரக் கட்டிடத்தை உலக வங்கியின் பங்களிப்புடன் ஆரம்பிப்பது தொடர்பிலான பல கலந்துரையாடல்கள் இடம்பெற்றுள்ளதுடன், நிரந்தரக் கட்டிடம் ஒன்றை நிர்மாணிப்பதற்கான நடவடிக் கைகள் எப்போது ஆரம்பிக்கப்படும் என அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that though three years have passed since the Sri Lanka Institute of Advanced Technological Education (SLIATE) in Mannar District, which is under the Ministry of Education, started the Higher National Diploma courses, this institution is still functioning in a temporary building;

(b) Will he admit that -

(i) as a result, only Information Technology, English and Tourism courses have been started;

(ii) laboratory facilities for courses are not available; and

(iii) it is not possible to commence courses like Accounting and Management?

(c) Is he also aware that more than a year has passed since a land of five acres in Uilankulam that belonged to the Mannar Divisional Secretary's Division was donated by Mannar District Secretariat to the then Ministry of Higher Education to construct a permanent building for the SLIATE ?

(d) Will he state the date on which the construction of a permanent building for the SLIATE in Mannar will be started, as several discussions took place to construct a permanent building with the contribution from the World Bank?

(e) If not, why?

**ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය (නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය)**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல - திறன்கள் அபிவிருத்தி, தொழில் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்க இராஜாங்க அமைச்சர்)

(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola - State Minister of Skills Development, Vocational Education, Research and Innovation)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

අංක 201, තලෙයිමන්නාරම පාර, මන්නාරම ලිපිනයෙහි පිහිටි Provincial English Support Centreහි බදු පදනම මත මෙම ආයතනය පවත්වාගෙන යනු ලබයි.

(ආ) (i) මෙම ආයතනයෙහි පහත දක්වා ඇති පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

- Higher National Diploma in Information Technology (Full-time)
- Higher National Diploma in English (Full-time)
- Higher National Diploma in Tourism (Full-time)

(ii) Higher National Diploma in Information Technology පාඨමාලාව පවත්වාගෙන යෑමට අවශ්‍ය පහසුකම් -රසායනාගාර සහ විද්‍යාගාර පහසුකම්- ඇති මන්නාරම Mn/St. Xavier's Boys' College හි පරිගණක විද්‍යාගාරය බදු පදනම මත ලබාගෙන පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි.

(iii) බදු පදනම මත ලබාගෙන ඇති ගොඩනැඟිලිවල පහසුකම් නොමැති නිසා ආයතනය සඳහා යෝජිත නව ගොඩනැඟිලි සම්පූර්ණ කළ පසු Accountancy, Management යනාදි පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ.

බදු පදනම මත ලබාගෙන ඇති ගොඩනැඟිලිවල පහසුකම් නොමැති නිසා තවත් පාඨමාලා පවත්වා ගැනීමේ හෝ වැඩි කිරීමේ අපහසුතාව තිබේ.

(ඇ) ඔව්.

(ඈ) ඔව්.

2020 නොවැම්බර් මස සිට ඉදි කිරීම් ආරම්භ කිරීමට කටයුතු සූදානම් කොට ඇත.

(ඉ) අදාළ නොවේ.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**

(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)

(The Hon. Charles Nirmalanathan)

நன்றி. கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, இந்த SLIATE நிறுவனமானது மன்னார் மாவட்டத்தில் ஆரம்பிக்கப் பட முதலாவது உயர் கல்வி நிறுவனமென நான் நினைக்கின்றேன். இந்த நிறுவனம் ஆரம்பிக்கப்பட்டு மூன்று வருடங்கள் கடந்துள்ளன. எதிர்வரும் நவம்பர் மாதத்தில் இதற்குரிய நிரந்தரக் கட்டடத்துக்கான வேலைகள் ஆரம்பிக் கப்படுமென நீங்கள் கூறினீர்கள். அதற்கான நிதி ஒதுக்கப்பட்டு விட்டதா? அல்லது எதிர்வரும் வரவு செலவுத்திட்டத்தில்தான் நிதி ஒதுக்கப்படுமா? என்று நான் கேட்க விரும்புகிறேன்.

**ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல)
(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola)

ගරු මන්ත්‍රීතුමනි, එයට ලබා දී තිබුණු ආධාර මත තමයි එය ගොඩනැඟෙන්නේ. ඒ සඳහා අවශ්‍ය වූ ටෙන්ඩර් පිළිගැන්වීම සඳහා අපි කටයුතු යොදා තිබෙනවා. ඒ අනුව ඔක්තෝබර් මාසයේ එම කටයුතු නිම වුණාට පසුව මෙම වසරේ නොවැම්බර් මාසයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ හැකියි. ලෝක බැංකු ආධාර මත ඒ සඳහා වෙන් කර තිබුණු මුදල්වලින් එය සිදු කරනවා.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நன்றி. எனது இரண்டாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன். சில மாதங்களுக்கு முன்னர் SLIATE நிறுவனத்தில் English Diploma கற்கைநெறியை முடித்த கிட்டத்தட்ட 28 பேர் ஆசிரியர் நியமனத்தை எதிர்பார்த்திருக்கிறார்கள். அந்த வெற்றிடங்களை நிரப்புவது வட மாகாண ஆளுநர் ஆவார். அந்த வகையில், வட மாகாண ஆளுநருக்கு ஆலோசனை வழங்கி, HND கற்கைநெறியை முடித்தவர்களை ஆசிரியர் களாக நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க முடியுமா? என நான் கேட்க விரும்புகிறேன்.

**ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல)
(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා අවශ්‍ය කටයුත්තක් කරන්න තිබෙනවා නම්, අපගේ උපරිම සහයෝගය ලබා දෙන්නම්. ආණ්ඩුකාරතුමාට අවශ්‍ය ලියකියවිලි හෝ ඒ අවශ්‍ය උපදෙස් හෝ අපෙන් ලබා දිය යුතු තොරතුරු ඇත්නම් ඔබතුමා ඒ ගැන සඳහන් කරන්න. මා ඒ සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර දෙන්නම්, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා. අදාළ කටයුතු අයත් වන්නේ ආණ්ඩුකාරතුමාට සහ එම ආයතනයට. නමුත් එම දරුවන් වෙනුවෙන් ඕනෑම උදව්වක් කරන්න අපි කටයුතු සූදානම් කරන්නම්. ඒ සඳහා අවශ්‍ය තොරතුරු ඔබතුමා ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7-217/2020-(1), ගරු මොහමඩ් මුසම්මිල් මහතා.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ගරු වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8-254/2020-(1), ගරු වේලු කුමාර් මහතා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ගරු වැවිලි අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 - 419/2020 - (1), ගරු වරුණ ලියනගේ මහතා.

- *[සභා ගර්භය තුළ නැත.]*

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ PL කාණ්ඩයේ සේවකයන්: උසස්වීම්

இலங்கை போக்குவரத்துச் சபையின் PL வகுதி அலுவலர்கள்: பதவியுயர்வு
EMPLOYEES OF PL CATEGORY OF SRI LANKA TRANSPORT BOARD: PROMOTIONS

16/2020

**10. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු, කොන්දොස්තර හා කාර්මික මට්ටමේ (PL කාණ්ඩයේ) නිලධාරින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුව වැටුප් ලබන බවත්;

(ii) එකී PL කාණ්ඩයේ නිලධාරින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුව උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු, කොන්දොස්තර හා කාර්මික මට්ටමේ (PL කාණ්ඩයේ) නිලධාරින් සංඛ්‍යාව සහ විධායක මට්ටමේ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධාරින්ට එම උසස්වීම් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම උසස්වීම් ලබා දෙන ශ්‍රේණි කවරේද;

(iv) එම උසස්වීම් ලබා දෙන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුවද;

(v) නොඑසේ නම්, කවර ක්‍රමවේදයකට අනුවද;

(vi) දැනට සිටින විධායක නිලධාරින්ට අමතරව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුව ලබාදෙන උසස්වීම් මඟින් එක් ඩිපෝවකට අලුතින් පත්වන විධායක මට්ටමේ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු හේෂා විතානගේ මහතා]

போக்குவரத்து அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) இலங்கை போக்குவரத்துச் சபையின் சாரதிகள், நடத்துனர்கள் மற்றும் தொழில்நுட்ப மட்டத்தைச் சேர்ந்த (PL வகுதி) அலுவலர்கள் 3/2016 இலக்கமுடைய பொது நிருவாக சுற்றறிக்கைக்கு அமைவாக சம்பளம் பெறுகின்றார்கள் என்பதையும்;

(ii) மேற்படி PL வகுதியின் அலுவலர்களுக்கு 3/2016 இலக்கமுடைய பொது நிருவாக சுற்றறிக்கைக்கு அமைவாக பதவியுயர்வு வழங்கப்படுவதற்கான நடைமுறையொன்று இருக்கின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இலங்கை போக்குவரத்துச் சபையின் சாரதிகள், நடத்துனர்கள் மற்றும் தொழில்நுட்ப மட்டத்தைச் சார்ந்த (PL வகுதியின்) அலுவலர்களின் எண்ணிக்கை மற்றும் நிறைவேற்று மட்டத்தைச் சேர்ந்த அலுவலர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இலங்கை போக்குவரத்து சபையின் அலுவலர்களுக்கு இப்பதவியுயர்வுகள் வழங்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி பதவியுயர்வு வழங்கப்படும் தரங்கள் யாவையென்பதையும்;

(iv) மேற்படி பதவியுயர்வுகள் 3/2016 இலக்கமுடைய பொது நிருவாக சுற்றறிக்கையின் பிரகாரம் வழங்கப்படுமா என்பதையும்;

(v) இல்லையெனில், பின்பற்றப்படும் நடைமுறை யாதென்பதையும்;

(vi) தற்போதுள்ள நிறைவேற்று அலுவலர்களுக்கு மேலதிகமாக 3/2016 இலக்கமுடைய பொது நிருவாக சுற்றறிக்கையின் பிரகாரம் வழங்கப்படுகின்ற பதவியுயர்வுகளின் வாயிலாக ஒவ்வொரு டிப்போவிற்கும் புதிதாக நியமிக்கப்படுகின்ற நிறைவேற்று மட்டத்திலான அலுவலர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Is he aware that-

(i) drivers, conductors and officers on technical level (PL Category) of the Sri Lanka Transport Board are receiving salaries as per the Public Administration Circular No. 3/2016; and

(ii) there is a method to award promotions to officers of aforesaid 'PL' category as per the Public Administration Circular No. 3/2016?

(b) Will he inform this House-

(i) the number of drivers, conductors and officers on technical level (PL category) as well as executive level officers serving in the Sri Lanka Transport Board;

(ii) whether these promotions are to be given to the officers attached to the Sri Lanka Transport Board;

(iii) if so, the grades to which those promotions are to be given;

(iv) whether those promotions are awarded as per the Public Administration Circular No. 3/2016;

(v) if not, the method followed; and

(vi) the number of executive level officers who will be newly appointed to each depot from among the promotions awarded as per the Public Administration Circular No. 3/2016, in addition to existing executive officers?

(c) If not, why?

**ගරු ගාමිණී ලොකුගේ මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Transport)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නැත.

(ii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියැදුරු, කොන්දොස්තර හා කාර්මික මට්ටමේ (PL කාණ්ඩයේ) නිලධාරින් හට වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුව නොවන බවත්, උක්ත නිලධාරින්ගේ වැටුප් ගෙවීම සඳහා අදාළ කරගනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30/2006 හා 2/2016 අනුවය. ඔවුන් හට උසස්වීම් ලබා දෙන්නේ උක්ත චක්‍රලේඛ හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටි පදනම් කරගෙනය.

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2020.06.30 දිනට සේවක සංඛ්‍යා විස්තරය අනුව,

| | |
|---|---|
| රියැදුරු | - 9304 |
| කොන්දොස්තර | - 9301 |
| කාර්මික | - 3993 |
| විධායක | - 773 |

(ii) උසස්වීම් ලබාදීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SCFR/2019 දරණ නඩුව පවතින බැවින් සහ එය අධිකරණයේ විභාගයට භාජන වන බැවින් මෙම අවස්ථාවේදී උසස්වීම් ලබාදීම තාවකාලිකව අත්හිටුවා ඇත.

(iii) අදාළ නැත.

(iv) අදාළ නැත.

(v) කාර්ය මණ්ඩල සේවකයන්ගේ වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2016 අනුව සකසා නොමැති අතර, අධිකරණයේ නඩුවක් පවතින බැවින් දැනට උසස්වීම් ලබාදීම සිදුනොකරන අතර, ඒ සඳහා අදාළ කරගත යුත්තේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30/2006 හා 2/2016 සහ බඳවා ගැනීම් හා උසස්කිරීම් පටිපාටියයි.

(vi) අදාළ නැත.

(ඇ) අදාළ නැත.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ස්තූතියි, ගරු ඇමතිතුමනි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම මේ ප්‍රශ්නය ඇහුවේ, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයන්, නිලධාරින් පත්වෙන ක්‍රමවේදය, උසස් වෙන ක්‍රමවේදය පිළිබඳව යම් අදහසක් ගන්නයි. ගරු කථානායකතුමනි, ඔබතුමාත් මා කියන කාරණයට එකඟ වෙයි. මේ රටේ සම්ප්‍රදායයක් නිර්මාණය වෙලා තිබෙනවා, රජයක් නැත්නම් ආණ්ඩුවක් වෙනස් වෙනකොට ඡන්ද ප්‍රතිඵල නිකුත් වෙලා ඉවරවෙනකොටම ඩිපෝවක නම්, ඩිපෝ අධිකාරිවරයා නිකම්ම වෙනස් වෙනවා. ඡන්ද ප්‍රතිඵලය එනකොටම, පත්වීමක් දෙන්න ඉස්සෙල්ලා කොන්දොස්තර මහත්මයෙක් හෝ රියදුරු මහත්මයෙක් හෝ ඇවිල්ලා බොහෝ තැන්වල ඩිපෝ අධිකාරි විධියට පත් වෙනවා. මෙක ඉතිහාසය පුරා එන සම්ප්‍රදායයක්. අපි දකිනවා, සමහර කාලවල පාට පාට ඉටි කොළ ඩිපෝ භූමියේ අදිනවා. එතකොට ශ්‍රී ලංකා ගමන ගමන මණ්ඩලය මැතිවරණ කාලයේදී දේශපාලන පක්ෂවල මැතිවරණ කාර්යාල බවට පත් වෙනවා. ගරු කථානායකතුමනි, මේක තවමත් සිද්ධ වෙනවා. මෙවර මැතිවරණ ප්‍රතිඵලයෙන් පසුවත් එය සිද්ධ වුණා.

ගරු ඇමතිතුමාගෙන් මම අහනවා, මේ තත්ත්වය ඉදිරියටත් සිදුවීම නතර කර ගන්න යම් ක්‍රමවේදයක් තිබෙනවාද, නැත්නම් තවදුරටත් මේ රටේ කොන්දොස්තර මහත්මයෙක් හරි රියදුරු මහත්මයෙක් හරි ඩිපෝවේ කළමනාකරු විධියට පත්වීම ඉදිරියටත් වෙනවාද කියලා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මම හිතන හැටියට, සුදුසුකම් නැතුව මින් ඉදිරියට එසේ වෙන්නේ නැහැ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
එහෙම පත්වීම් දෙන ක්‍රමවේදයක් තිබෙනවාද කියන එක තමයි මම ප්‍රශ්නයෙන් අහලා තිබුණේ

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
Circular එකක් තිබෙනවා, ඒ අනුවයි ක්‍රියා කරන්නේ. යම්කිසි නීතිමය ක්‍රියාමාර්ග අනුවයි ක්‍රියා කරන්නේ. දැනට අධිකරණයේ නඩුවක් තිබෙනවා. ඒ නඩුව අවසන් වනතුරු ඒකත් කරන්න බැහැ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නයටත් සාධාරණ උත්තරයක් ලබා දෙයි කියා මා හිතනවා. ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් අවභාවිත වීම සම්බන්ධයෙන් ඉතිහාසයේ ඕනෑ තරම් පූර්වාදර්ශ තිබෙනවා. එවැනි ආකාරයට බස් අවභාවිත වීම සම්බන්ධයෙන් නඩු තිබෙනවා. ඒ සම්බන්ධයෙන් එක එක මාධ්‍යවල ප්‍රකාශත් පළ වුණා. මේ බස් මුදල් ගෙවා පමණක් ලබා ගන්න කියලා අපගේ යහ පාලන ආණ්ඩුවෙන් යම් නිවැරැදි පූර්වාදර්ශයක් ලබා දුන්නා. ඒ කාලයේ ණයට බස් ගැනීමට කටයුතු කළේ නැහැ කියා මා විශ්වාස කරනවා. අපේ හිටපු ඇමතිතුමාත් මේ සභාවේ ඉන්නවා. ඉතිහාසයේ සිදු වුණු පාඩුවට අදාළ ඒ මුදල් ලබා ගැනීමට අධිකරණ ක්‍රියා මාර්ග ගත්තා හෝ නොගත්තා වෙන්න පුළුවන්. නමුත් ඒවා නැවත සිදු වුණේ නැහැ.

ගරු ඇමතිතුමනි, පාඩු ලබන ආයතනයක් වන ලංකා ගමනාගමන මණ්ඩලයට සිදු වුණු ඒ පාඩුව අය කර ගැනීමට යම් ක්‍රියා මාර්ග ගෙන තිබේද? ඒ වාගේම, පසුගිය නරක පූර්වාදර්ශ නැවත ඇති වීමට තිබෙන අවකාශ අහුරා තිබෙනවාද කියා මම දැනගන්න කැමැතියි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු මන්ත්‍රීතුමනි, දැනට අපට කරන්න පුළුවන් වන්නේ, අය කිරීමක් තිබෙනවා කියලා audit එකකින් පෙන්වනවා නම් නීත්‍යානුකූලව ඒවා අය කර ගැනීමයි. ඒ වාගේම, දැනට ඒ ආකාරයට නොමිලේ බස් ලබා දීමක් කොහේවත් සිද්ධ වෙන්නේ නැහැ.

## පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයෙන් කළ වැටලීම්: විස්තර

## பொலிஸ் போதைப்பொருள் ஒழிப்புப் பணியகத்தினால் மேற்கொள்ளப்பட்ட சுற்றிவளைப்புக்கள்: விபரம்

## RAIDS CARRIED OUT BY POLICE NARCOTICS BUREAU: DETAILS

64/2020

**11. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මඟින් සිදුකරනු ලැබූ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම් සිදු කිරීම වෙනුවෙන් ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබූ පොලිස් නිලධාරින්ගේ නම් කවරේද;

(iii) ඒ වෙනුවෙන් එම එක් එක් පොලිස් නිලධාරියාට ලබා දෙන ලද ත්‍යාග මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත වැටලීම්වලදී අත්අඩංගුවට ගත් එම මත්ද්‍රව්‍ය, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතට පත් කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබා සිටින පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම් කවරේද;

(vi) එම පොලිස් නිලධාරින්ට එරෙහිව පැවැත්වෙන විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු චමින්ද විජේසිරි මහතා]

பிரதம அமைச்சரும் நிதி அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்டவினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை பொலிஸ் போதைப்பொருள் ஒழிப்புப் பணியகத்தினால் மேற்கொள்ளப்பட்டுள்ள சட்டவிரோத போதைப்பொருள் சுற்றிவளைப்புக்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி சுற்றிவளைப்புக்களை மேற்கொண்டமைக்கு சனாதிபதி விருது வழங்கி கௌரவிக்கப்பட்ட பொலிஸ் உத்தியோகத்தர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பொலிஸ் உத்தியோகத்தருக்கும் அது சார்பாக வழங்கப்பட்ட பரிசுத் தொகைகள் தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iv) மேற்படி சுற்றிவளைப்புக்களின் போது கைப்பற்றப்பட்ட போதைப்பொருள், போதைப்பொருள் வியாபாரத்தில் ஈடுபடுகின்றவர்களின் கைகளுக்குச் சென்றடையச் செய்தல் தொடர்பாக குற்றஞ்சாட்டப்பட்டுள்ள பொலிஸ் உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(v) அவர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(vi) மேற்படி பொலிஸ் உத்தியோகத்தர்களுக்கு எதிராக மேற்கொள்ளப்படும் புலனாய்வுகளின் முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Will he inform this House-

(i) the number of raids carried out by the Police Narcotics Bureau to seize illicit drugs from year 2015 to date;

(ii) the names of police officers who received Presidential Awards for carrying out those raids;

(iii) the prize money offered to each police officer, separately;

(iv) the number of police officers who are accused of smuggling drugs seized in the raids to the drug racketeers;

(v) their names; and

(vi) the progress of the inquiries held against the said police officers?

(b) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්න සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පති, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හා නියෝජ්‍ය පොලිස්පති, පොලිස් මත් ද්‍රව්‍ය නාශක කාර්යාංශය වෙතින් වාර්තා කැඳවූ අතර, එම වාර්තා පදනම් කරගනිමින් තමයි ඔබතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේ.

(අ) (i) වැටලීම් 1,720කි.

අංක (ii) හා (iii) මඟින් කර ඇති විමසීම පරිදි එම වැටලීම් සිදුකිරීම වෙනුවෙන් ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබූ පොලිස් නිලධාරින්ගේ නම් සහ ඒ වෙනුවෙන් එම එක් එක් පොලිස් නිලධාරියාට ලබා දෙන ලද ත්‍යාග මුදල් වෙන් වෙන් වශයෙන් පහත පරිදි වගුවේ සඳහන් කර ඇත.

| අනු අංකය | නිලය | නිල අංකය | නම | 2015.01.01 දින සිට 2020.09.26 දින දක්වා ලබා දෙන ලද ත්‍යාග මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 1 | නි.පො.ප. | - | සංජීව මැදවත්ත | - |
| 2 | ප්‍ර.පො.ප. | - | ටී.ඒ.ඩී.ඒ.ටී. සුබෝධ | 1568800.00 |
| 3 | පො.ප. | - | එම්. රංගජීව නෙවමාල් | 2927100.00 |
| 4 | පො.ප. | - | ඩබ්ලිව්.එල්. ජයරත්න | 818150.00 |
| 5 | උ.පො.ප. | - | කේ.කේ. මහින්ද | 718050.00 |
| 6 | උ.පො.ප. | - | ඩබ්ලිව්.උදාර චතුරංග ප්‍රේමසිරි | 388650.00 |
| 7 | පො.සැ. | 49446 | අබේවික්‍රම (මියගිය) | 566700.00 |
| 8 | පො.කො. | 84054 | ඩී.එන්. වාකිෂ්ය | 557000.00 |
| 9 | පො.කො. | 60435 | යූ.ඒ.එස්. කුමාර | 1073300.00 |
| 10 | පො.කො. | 70731 | පී.එච්.එස්. වීරසිංහ | 248950.00 |
| 11 | පො.කො. | 67055 | ඒ.එල්.සී. කුමාර (විශ්‍රාමික) | 630600.00 |

(iv) පොලිස් නිලධාරින් 19 දෙනෙකු.

(v) ගරු අධිකරණයේ විභාග වන කරුණක් බැවින් හා එම වූදිත නිලධාරින් සම්බන්ධයෙන් මෙතෙක් අධිකරණ නියෝගයක් නිකුත් කර නොමැති බැවින්, ඔවුන්ගේ නම් සභාගත කිරීම සුදුසු නොවේ.

(vi) (1). පොලිස් නිලධාරින් අතුරින් 13 දෙනෙකු රක්ෂිත බන්ධනාගාර ගතකර ඇති අතර, සෙසු පොලිස් නිලධාරින් 06 දෙනා රැඳවුම් නියෝග මත තබාගනිමින් විමර්ශන කටයුතු සිදු කරගෙන යනු ලබයි. මෙම විමර්ශනයට අදාළව කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී. 35602/01/20 යටතේ අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති අතර, අදාළ නඩු 2020.10.12 දින නැවත කැඳවීමට නියමිතව ඇත.

(2) අත් අඩංගුවට ගන්නා ලද මෙම සැකකරුවන් විසින් මත් ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගෙන ඇති රුපියල් 191,627,834.00ක් වටිනා වාහන සහ දේපළ මුදල් විශුද්ධිකරණ පනත යටතේ තහනම් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණ අංක 01හි නඩු අංක බී 36128/01/20 යටතේ ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත.

(3) එසේම, මේ සම්බන්ධයෙන් මෙතෙක් සිදු කර ඇති විමර්ශනවලදී මෙම සැකකරුවන්ගෙන් අනාවරණ කර ගන්නා ලද තොරතුරු අනුව පහත සඳහන් දෑ අත් අඩංගුවට ගෙන ඇත.

1. T56 වර්ගයේ ගිනි අවි 02ක් සහ එම මැගසින් 05ක්.
2. T56 වර්ගයේ ජීව උණ්ඩ 81ක්.
3. පිස්තෝල 03ක් සහ 9mm වර්ගයේ ජීව උණ්ඩ 40ක්.
4. හෙරොයින් කිලෝග්‍රෑම් 11.888 මිලිග්‍රෑම් 256ක්.
5. ඉලෙක්ට්‍රෝනික තරාදි 02ක්.
6. මුදල් රුපියල් 34,017,130.00ක්.
7. රුපියල් 5,000 ව්‍යාජ නෝට්ටු 32ක්.
8. කොකේන් මිලිග්‍රෑම් 380ක්.

(4) අත් අඩංගුවට ගන්නා ලද පොලිස් නිලධාරින් විසින් මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් වෙත ලබාදී ඇති සෙසු මත් ද්‍රව්‍ය සහ එම ජාවාරම්කරුවන් අත් අඩංගුවට ගැනීම සඳහා වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරගෙන යනු ලබයි.

(ආ). පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, ඔබතුමා අවසානයේ පිළිතුරු සැපයුවේ මම අසා තිබෙන ප්‍රශ්නයකට නොවෙයි කියලායි මට හැඟෙන්නේ. එවැනි කාරණයක් සම්බන්ධව මම මේ ප්‍රශ්නයෙන් අසා නැහැ. කෙසේ වෙතත්, මගේ ප්‍රශ්නයට පිළිතුර ලැබිලා තිබෙනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ඔබතුමා අසා නැති, මම උත්තර දීලා තිබෙන ප්‍රශ්නය මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඔබතුමා අමතර උත්තර ටිකක් ලබා දුන්නා. ඒ උත්තරවලට අදාළ ප්‍රශ්නයක් මම අසා නැහැ. කෙසේ වෙතත්, රටට සහ-

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ඔබතුමා මට චෝදනාවක් කළේ. කරුණාකර කියන්න, පිළිතුරු නොදුන්නු ඔබතුමාගේ ප්‍රශ්නයක් තිබෙනවාද? නැත්නම් අහපු නැති-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමා අමතර පිළිතුරක් ලබාදීලා තිබෙනවා. ඔබතුමා පිළිතුරේ අවසාන කොටසේ සඳහන් කළ උපකරණ සහ ප්‍රමාණ පිළිබඳව මම 11වැනි ප්‍රශ්නයේ කොතැනවත් අසා නැහැ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ඔබතුමා කියන්නේ, ප්‍රශ්න අංක (අ) (iv) හි සඳහන් "ඉහත වැටලීම්වලදී අත් අඩංගුවට ගත් එම මත් ද්‍රව්‍ය, මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතට පත් කිරීම සම්බන්ධයෙන්..." වන ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර සම්බන්ධයෙන් ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරේ අවසාන කොටසේ උපකරණ සහ ප්‍රමාණ පිළිබඳව සඳහන් කළා. ඒක මගේ ප්‍රශ්නයට ලබා දීපු අමතර පිළිතුරක්. මම එවැනි දෙයක් අසා නැහැ. ඒකට කමක් නැහැ, ඒ පිළිතුර රටට වැදගත් දෙයක් නේ. කාලය ගන්නේ නැතිව මම මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්, ගරු ඇමතිතුමනි.

අපි දන්නවා, මේ මත්ද්‍රව්‍ය අල්ලන අය අතර ජනාධිපති සම්මානත් ලැබුණු නිලධාරින් සිටින බව. ඔවුන් මත් ද්‍රව්‍ය අල්ලනවා. අවසානයේදී ඔවුන් සන්තකයේ තිබිලාත් මත් ද්‍රව්‍ය අල්ලනවා. ගරු ඇමතිතුමනි, වර්තමානයේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව තුළත්, කොයි ආණ්ඩුව තුළත් සිද්ධ වෙච්ච කාරණයක් තමයි මෙවැනි උදව්ව රැකීම. ඒක පැහැදිලි කර ගන්න පුළුවන් කාරණයක් මම කියන්නම්. පසුගිය දවසක එක්තරා ඇමතිවරයෙක් කිව්වා "අපට උදව් කළා නම්, නීතිය මොනවා කළත්, තරාතිරම නොබලා ඔවුන් බේරා ගැනීම වෙනුවෙන් ඉන්නවා" කියලා. ඔබතුමාගේ දකුණු පැත්තේ කනෙන් වුණත් බලාගන්න පුළුවන්. වගකිව යුතු ඇමතිවරයෙක්, අපට සෘජුව පිළිතුරු දෙන ඇමතිවරයෙක්. ඔබතුමන්ලාගේ ආණ්ඩුව තුළ ඉන්න ඇමතිවරයෙක් මෑතක එවැනි ප්‍රකාශයක් සිදු කර තිබෙනවා. එහෙම නම් මේවා කොතෙක් ඇල්ලුවත් වැඩක් වෙන්නේ නැහැ නේ. ඒ අල්ලන කට්ටිය දේශපාලන වශයෙන් සම්බන්ධයි නම්, දේශපාලන ගෝලයන් නම්, ඔවුන් බේරා ගන්නවා කියනවානේ. එයාලා අපේ කට්ටිය නම් අපි බේරා ගන්නවා කියලා නිර්භයව මාධ්‍යය ඉදිරියට ඇවිත් කියනවා. මත්ද්‍රව්‍ය සම්බන්ධව සැබෑ වැටලීම් කළත්, සැබෑ කට්ටිය හසු කර ගැනීමට තිබෙන ප්‍රධානම බාධකය තමයි, මෙහෙම දේශපාලන වශයෙන් අතපෙවීම් සිදු කර ඔවුන් බේරා ගැනීම. එයට පිළිතුරක් දෙන්න, ගරු ඇමතිතුමනි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
කරුණාකරලා කියන්න, එහෙම බේරා ගත්තේ කවුද කියලා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බේරා ගන්නවා කියලා කියනවානේ, ගරු ඇමතිතුමනි. ඔබතුමාට එතුමා දකුණු කනෙන් පෙන්වන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාම කියලා තිබෙනවා. ඒ වීඩියෝ එක මා සතුව තිබෙනවා. අපට උදව් කරනවා නම්, අපේ නම්, අපි එයාලා බේරා ගැනීමට කටයුතු කරනවා කියලා කියා තිබෙනවා. මා සතුව ඒ වීඩියෝ එක තිබෙනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ඒ මේවා නොවෙයි

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේවා නොවෙයි නම්, වෙන වැරැදිවලදී කමක් නැහැ කියලාද කියන්නේ?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
නැහැ. නැහැ. තමුන්නාන්සේලා දමපු බොරු නඩු තිබෙනවා නේ. අන්න ඒවා පිළිබඳව ඒ කියන්නේ. [බාධා කිරීමක්] ඔබතුමන්ලා දැන් මේවා ගැන කථා කරනවා. නමුත්, තමුන්නාන්සේලාගේ කාලයේ, ඒ අවුරුදු ගණනේ කරපු දේවල් ගැන කථා කරන්නේ නැහැ. ඔබතුමන්ලාගේ කාලයේ මේ විධියට Police Narcotics Bureau එකේ කුඩු අරගෙන ගිහින් විකුණපු අය කවදාවත් ඇල්ලුවාද? අවුරුදු පහක් තිබුණා. ඇල්ලුවාද? අපි අල්ලලා තිබෙනවා; දඬුවම් කරලා තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම දැන් එතුමාගෙන් ඇහුවේ ඒක නොවෙයි නේ. ඔබතුමාටත් කියන්න පුළුවන් ඇමතිතුමා කියන්නේ වෙන කථාවක් කියලා. මම අහපු දෙයට උත්තරයක් ගරු ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙන්නේ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ලේසි කරන්නයි යන්නේ. පොලීසිය භාර රාජ්‍ය ඇමතිවරයා හැටියට ඔබතුමා මේ දරන ප්‍රයත්නය, මේ කරන උත්සාහය, මේ රටේ ගෙනයන වැඩ පිළිවෙළ අසාර්ථක වෙලා තිබෙන්නේ යම් දේශපාලන අතපෙවීමක් තිබෙන නිසායි. ළඟ සිටින ඇමතිවරයාගේ නම කියලා මම උදාහරණයක් කිව්වේ. ඔබතුමා වගකිව යුතු ඇමතිවරයකු හැටියට ඒකට හයිය දෙන වචනයක් දෙන්න.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මට නම් එහෙම එකක් ආරංචි වුණේ නැහැ. එහෙම එකක් තිබෙනවා නම්, ඔබතුමා හරියට කියනවා නම්, සොයලා බලා අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්. මාත් මේ පාර්ලිමේන්තුවේ අවුරුදු 35ක්, 40ක් තිස්සේ ඉන්නවා. මොන කාලයේද -මොන යුගයේද- වැඩියෙන් වැරැදි වුණේ, පොලිස් නිලධාරින්ට බලපෑම් කළේ කියන එක මම හොඳටම දන්නවා. ඒ නිසා පසුගිය අවුරුදු පහ ගැනත් හිතන්න. FCID එකක් හදලා මොකක්ද කළේ? තමන්ට අවශ්‍ය මිනිසුන්ට පහර ගැසීම මිස සාධාරණයක් නොවෙයි නේ කළේ. පොලීසිය භාරව ඉන්න රාජ්‍ය ඇමතිවරයා විධියට මම එහෙම කරන්නේ නැහැ. මම හැම විටම සාධාරණව සහ යුක්ති සහගතවයි කටයුතු කරන්නේ. කිසි කෙනකු වැරදි ලෙස අත්අඩංගුවට ගන්න කියලාවත් කාටවත් කියන්නේ නැහැ. එහෙම කරන එක වැරදියි. මොකද, ඒ මිනිස්සුන්ටත් අයිතියක් තිබෙනවා. තමුන්නාන්සේ වැල්වටාරම් අහනකොට මටත් උත්තර දෙන්න වෙන්නේ ඒ විධියටමයි. ඒ නිසා කරුණාකරලා අහන ප්‍රශ්නය සෘජුව අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
සෘජුව තමයි අහන්නේ. මගේ දෙවන අතුරු ප්‍රශ්නය අහන්නද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
දෙවැනි අතුරු ප්‍රශ්නයද, තුනද, හතරද, පහද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අනේ! ගරු ඇමතිතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය. සමාවෙන්න. මම ඔබතුමා එක්ක තර්ක කරන්නේ නැහැ. ඔබතුමා අපි අගය කරන ඇමතිවරයෙක්. මම ඔබතුමා කියන චෝදනා පිළිගන්න කැමැතියි. හැබැයි, ඔබතුමාටත් ඒ චෝදනාව පිළිගන්න වෙනවා දකුණු පැත්ත බැලුවාම. පසුගිය කාලයේ පොලිස් ඇමතිවරයා කවුද කියන කාරණය-[බාධා කිරීමක්] ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඉන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, එතුමා මගේ නම කිව්වා.

එතුමා මගේ නම කිව්වා. දැන් නොවෙයි, ඉස්සෙල්ලා කිව්වා, ජොන්ස්ටන් ප්‍රනාන්දු කියලා. එතුමා ළඟ වීඩියෝ එකක් තිබෙනවා කිව්වා. ඒ වීඩියෝ එක මොකක්ද කියලා මම එතුමාගෙන් අහනවා. ගරු මන්ත්‍රීතුමනි, වීඩියෝ එක මොකක්ද කියලා කටින් කියන්න. වීඩියෝ එක දාන්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්] එතුමාට මයික් එක දෙන්න. දෙපැත්තේම යනවා ඔය කතන්දරය.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමා යම් කිසි කාරණයකදී මාධ්‍යයට කියනවා "අපට උදවු කරලා තිබෙනවා නම්, අපේ කට්ටිය නම් බේරා ගන්නවා" කියලා වගකිව යුතු මාධ්‍ය ආයතනයක් ඉදිරියේ කියනවා. මම ළඟ තිබෙනවා ඒක.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔය කියන්නේ කුරුණෑගල ප්‍රශ්නය ගැනනේ? මම කියන්නම්, ඒ ගැන. හංගන්න දෙයක් නැහැ. එහි මුළු කථාවම අහන්න. මම

එතැනදී කියන්නේ දේශපාලනඥයන්ට ඇඟිලි ගහන්න දෙන්නේ නැහැ කියන එකයි. නමුත්, ඒ ප්‍රකාශයේ කෑල්ලයි දැම්මේ. අපේ දිස්ත්‍රික්කයේ අපේම පක්ෂය නියෝජනය කරන, අපිත් එක්ක එකට ඉන්න පක්ෂයක දේශපාලනඥයෙක් කුරුණෑගල නගරාධිපතිතුමා අත් අඩංගුවට ගන්නවා කියලා යම් ප්‍රකාශයක් කළා. මම කිව්වා, දේශපාලනඥයන් මැදිහත් වෙලා අත් අඩංගුවට ගන්න දෙන්නේ නැහැ කියලා. [බාධා කිරීමක්] ඒක කිව්වා. ඒ කථාව ඔබතුමා හොඳට අහන්න. මම කිව්වේ, පසුගිය රජය වගේ දේශපාලනඥයන්ට නීතිය අතට ගන්න දෙන්නේ නැහැ කියන එකයි. නීතිය ක්‍රියාත්මක කරන තැනක් තිබෙනවා. ඒක ඔබතුමා හොඳට බලන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ඔබතුමා මේක අහපු එක ගැන. මම ඇත්තටම මේකට උත්තරයක් දුන්නා. නමුත්, ඒක මාධ්‍යයේ ගියේ නැහැ. සජීවීව ගියේ විවාදය විතරයි. "මයිලකට අත තියන්න දෙන්නේ නැහැ" කියන කෑල්ල විතරක් අරගෙන මට පහර දුන්නා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔය ඔක්කෝම එකම ප්‍රකාශය. මම කියපු දෙයක් ආපසු ඉල්ලා අස් කර ගන්න භය වෙන්නේ නැහැ. කිව්වා නම් මම කෙළින් කියනවා. ඒක තමයි ඇත්ත. ඒ ප්‍රශ්නයේදී දේශපාලනඥයන් නීතිය අතට අරගෙන කටයුතු කරන්න ගියාම ඒකට ඉඩ දෙන්න බැහැ ගරු කථානායකතුමනි. දේශපාලනඥයන්ට නීතිය අතට ගන්න ඉඩ දෙන්නේ නැහැ අපේ රජය. ඒ ප්‍රතිපත්තියේ අදත් අපි ඉන්නවා, හෙටත් ඉන්නවා. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. [බාධා කිරීමක්]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කවුද ඒ ඇමතිතුමා?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඒක ඔබතුමාට බලා ගන්න පුළුවන්. පටලා ගන්න එපා. [බාධා කිරීමක්]ඒක ගියා. ඒක ගැටලුවක් කර ගන්න ඕනෑ නැහැ. සාමාන්‍යයෙන් මම දේශපාලනඥයන්ගේ නම් කියන්නේ නැහැ. හැබැයි, ඒ වීඩියෝ එක ඔබතුමා බලන්න. Facebook එකට ගිහිල්ලා බලන්න. එතකොට කවුද කියලා දැන ගන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් විනාඩි හතක් ගත්තා. [බාධා කිරීම්] මේ කටයුතු ඉක්මනින් අවසන් කරන්න සහයෝගය දෙන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ නේ. එතුමා -ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා- මැදිහත් වුණා, රීති ප්‍රශ්නයක් මතු කරමින්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අතුරු ප්‍රශ්න අහලා ඉවර කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඇත්තටම FCID එකයි- [බාධා කිරීම්] පසුගිය අවුරුදු හතරහමාර පහ තුළ කවුද කළේ කියනවා නම් ඔබතුමා දන්නවා ඒ අය ඉන්නේ කොයි කඳවුරේද කියන කාරණාව. හැබැයි, එදාත් අපි චෝදනා කළා, ගරු ඇමතිතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ආයෙත් ප්‍රශ්නයෙන් පිට යනවා නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දැන් විශේෂයෙන්ම-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට අගින් ඇවිල්ලා වැඩක් නැහැ, මුල ඉඳලා එන්න ඕනෑ. ප්‍රශ්නයට අගින් ආවොත්, හරුපයක් වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මුල ඉඳන් ආවා නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, ඇත්තටම මේ කථා බහ උදව්වක් වෙන්න ඇති ඔබතුමාට යම් තීරණයකට එන්න. ඒ කියන්නේ, මේ කාරණාවලදී දේශපාලනඥයන් මැදිහත් වෙන්න එපා කියන කාරණය සම්බන්ධයෙන්. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ කටයුතුවලදී පක්ෂ හා විපක්ෂ සියලු දේශපාලන අත පෙවීම් නවත්වන්න කියලා. රටට බලපා තිබෙන බරපතළ ප්‍රශ්නයක් තමයි මේ මත්ද්‍රව්‍ය පිළිබඳ කාරණය. ඒ උවදුර රටින් ඈත් කරන්න ඔවුන් වෙනුවෙන් ගන්න තීන්දු තීරණ මොනවාද කියලා මම අහනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මට ඒ ප්‍රශ්නය තේරුණේ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දැන් තේරෙන්නේ නැහැ. මොකද, අපටත් තේරෙනවා- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අන්තිමේදී ඔබතුමා අහපු ප්‍රශ්නයක් නැහැ. ඒකයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, දැන් ඔය වාගේ ප්‍රකාශ තිබෙනවානේ. පුද්ගලයා කවුද කියලා කියන්නේ නැහැ. දේශපාලන අත පෙවීමක් තිබෙනවා, බේරා ගන්නවා වාගේ කාරණා කියනවානේ. මේ කියන මැදිහත් වීම තුළ තමයි, රටේ නීතිය ක්‍රියාත්මක කරන්න බැරි වෙලා, අවසානයේ රට ව්‍යාකූල වෙන්නේ. මෙවැනි තත්ත්වයක් තුළ මධ්‍යස්ථව තීන්දු ගන්නවාය කියන කාරණය පැහැදිලිව රටට පෙනෙන්න යම් ක්‍රියාදාමයක් අමාත්‍යාංශය තුළින් අරගෙන තිබෙනවාද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ඔව්. අපි පොලීසියට හෝ නඩුකාරයන්ට කිසිම බලපෑමක් කරන්නේ නැහැ. පොලිස් නිලධාරියෙක් ස්වාධීනව පරීක්ෂණයක් පැවැත්වුවොත් ඒක උසාවියට ඉදිරිපත් කරනවා. බලපෑමක් කරන්න ඉඩ දෙන්නේ නැහැ. එහෙම බලපෑමක් සිදු වුණු අවස්ථා තිබෙනවා නම් ඔබතුමාට පුළුවන් ඒ පිළිබඳව දැනුම් දෙන්න. එතකොට අපි අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 - 106/2020 - (1), ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 167/2020 - (1), ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා. ඒකටත් කල් ගනීවි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු කථානායකතුමනි, එතුමා දීර්ඝ විස්තරයක් අසා තිබෙනවා. එම නිසා ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

(4th Start)

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 -190/2020- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.

**ගරු සිවඥානම් සිරීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கின்றேன்.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15 -218/2020- (1), ගරු මොහොමඩ් මුසම්මිල් මහතා.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 9 -419/2020- (1), ගරු වරුණ ලියනගේ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, වැවිලි අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රකාශය ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, 2020.10.07 වන දින පාර්ලිමේන්තු විවාදය පවත්වන අවස්ථාවේදී සෞඛ්‍ය ඇමතිනී ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය මාහට අභියෝගයක් කරමින් කියා සිටියේ, "කොවිඩ් වසංගතය අවසානයි" යනුවෙන් කිසිම දිනක ප්‍රකාශ කර නොමැති බවයි. එවැනි ප්‍රකාශයක් සිදු කර තිබේ නම්, එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස එතුමිය ඉල්ලා සිටියා. ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය කොවිඩ් - 19 නිවාරණය සම්බන්ධයෙන් 2020.09.03වන දින, "SL Army Media - You Tube" වැනලය වෙත කරන ලද ප්‍රකාශයෙන් උපුටා ගන්නා ලද ප්‍රකාශය මේ සමඟ මම ඉදිරිපත් කරමි. එහි පැහැදිලිව සඳහන් කර ඇත්තේ, "කොවිඩ් - 19 රෝගය මුළු ලෝකයේම අද සමාජය තුළ පැතිරිච්ච රෝගයක්. මම විශ්වාස කරනවා, මෙම රෝගය සමාජය තුළ පැතිරීම සම්පූර්ණයෙන්ම තුරන් කරවූ ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව කියලා" යනුවෙනි. තවද, "කොරෝනා වයිරසය මෙරට ජනතාව අතර ව්‍යාප්ත වන තත්ත්වයක් නොමැති බවත්, මහ ජනතාව අතර බෝවීමක් සිදුවන්නේ නැති බවත්ය..." යනුවෙන් එතුමියගේ ප්‍රකාශයක් Lanka C Newsහි 2020.04.22 වන දින සඳහන් කර තිබුණා.

ගරු කථානායකතුමනි, මේ කොවිඩ් ප්‍රශ්නය අවසන් නැහැ කියලා වෛද්‍යවරු හැම දාම කිව්වා. GMOA එකත් කිව්වා; MRI එකත් කිව්වා. නමුත් අවාසනාවකට, රජය දේශපාලන ලකුණු දමාගන්න "මේක අවසානයි" කිව්වා. කොවිඩ් වසංගතය ආරම්භ වුණු දා ඉඳලා මැතිවරණය අවසන් වෙනකම් මේ වසංගතය සම්පූර්ණයෙන්ම අවසන්ය කියන සිල්ලර කථාව කියපු නිසා තමයි ජනතාව ඒ දිහා සැහැල්ලුවෙන් බැලුවේ. රජය කියපු එක විශ්වාස කරලා, සාමාන්‍ය ජනතාව තමන්ට අවශ්‍ය ආරක්ෂාව සලසාගත්තේ නැහැ. මොකද රජය කියනවා නේ, මේක අවසානයි කියලා. රජය එහෙම කිව්වාට,අළු යට ගිනි පුපුරු වාගේ මේ වසංගතය තිබෙනවා. ජනතාව මීට වඩා පරික්ෂාකාරී වන්න ඕනෑ. ඒකයි, ඇත්ත තත්ත්වය.

ඊයේ - පෙරේදා ඇඟලුම් කම්හලක ඇති වූ සිද්ධිය බලන්න. ඒ කම්හලට, ඉන්දියාවෙන් පැමිණි අයගේ නම් ලැයිස්තුවයි, ඔවුන් නිරෝධායනය කළ ස්ථානවල විස්තරයි අපට දෙන්න කියලා මම රජයට අභියෝග කරනවා. එය විශාල සමාගමක්. ඔවුන් රටට විශාල සේවාවක් කරනවා. මම ඒ අයට කියනවා, සැප්තැම්බර් 22වන දා ඒ කම්හලට ඉන්දියාවෙන් පැමිණි අයගේ නම් ලැයිස්තුවයි, ඔවුන් නිරෝධානයනය කළ ස්ථානවල විස්තරයි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවට ඉදිරිපත් කරන්න ආණ්ඩු පක්ෂයේවරයෙකු හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (සෞඛ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - சுகாதார அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Health)
ගරු කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය මම අහගෙන හිටියා. ඒ ප්‍රකාශයේදී එතුමා කිව්වා, කොවිඩ්-19 වසංගතය ලංකාවෙන් තුරන් කළ බව මම කිව්වා කියලා. ඒ වාගේම එතුමා කියනවා, "කොවිඩ්-19 වසංගතය සමාජය තුළින් ඉවත් කළ රට ලංකාවයි" කියා Army වෙබ් අඩවියක හෝ YouTube එකේ තිබෙන ප්‍රකාශයක මම සඳහන් කර තිබෙනවා කියලා. ඔබතුමාගේ ප්‍රකාශයේම ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]ඔබතුමාට බාධා කළේ නැති නිසා මට උත්තරය දෙන්න ඉඩ දෙන්න. [බාධා කිරීමක්] මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා, එතුමාගේ ප්‍රකාශයට උත්තරයක් දෙන්න මට පොඩි වෙලාවක් දෙන්න කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක්. 1994දී අපි එකම පක්ෂයේ හිටියේ. එදා අපි එකම පක්ෂයකින් තමයි ඡන්දය ඉල්ලපුවේ. ඔබතුමා මගේ සහෝදර මන්ත්‍රීවරයෙක්. [බාධා කිරීමක්] කරුණාකර මට කථා කරන්න ඉඩ දෙන්න.

කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් මම කළ ඒ ප්‍රකාශයේ ඉතිරි ටිකත් ඔබතුමා අහන්න. ඔබතුමා කියන විධියට, Army website එකකට හෝ වෙනත් කුමන හෝ website එකකට මම කළ ඒ ප්‍රකාශය මට හොඳට මතකයි. මේ වෙලාවේ කොවිඩ් වසංගතය ලංකාවේ සමාජය තුළින් තුරන් කළ රටක් විධියට අපේ රට සලකන්න පුළුවන් කියලා ඒ ප්‍රකාශයේදී මම කිව්වා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම වෙලා නැහැ නේ.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මට කථා කරන්න ඉඩ දෙන්න, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නේ. ඒ කථාව මම කිව්වේ විශේෂයෙන්ම කාරණා කීපයක් මුල් කරගෙනයි. අපි සාමාන්‍යයෙන් අදියර හතරකින් තමයි විද්‍යානුකූලව මෙම රෝගය නිශ්චය කරන්නේ. පළමුවැනි අදියර - stage one - තමයි, කිසිම රෝගියෙකු නැති අදියර - no cases. දෙවැනි අදියර තමයි, තැනින් තැනින් රෝගීන් මතු වනවා, හැබැයි ඒ අය මතු වෙන්නේ කොහෙන්ද සහ ඔවුන්ගේ contacts අපට හොයා ගන්න පුළුවන් වීම.

තුන්වැනි අදියර තමයි, කන්දකාඩු පොකුර, නාවික හමුදා පොකුර ලෙස පොකුරු වශයෙන් රටේ රෝගීන් හමු වීම. හතර වැනි අදියර තමයි, ආතක් පාතක් නැතිව, සමාජය තුළ හැම තැනින්ම රෝගීන් මතු වීම. සමාජය තුළ හැම තැනකින්ම රෝගීන් මතු වනවා, ඒ රෝගීන් කොහෙන්ද මතු වුණේ කියලා හොයා ගන්න බැහැ. ඉන්දියාව, ඇමෙරිකාව වැනි රටවල ආතක් පාතක් නැතිව, රට පුරාම රෝගීන් මතු වනවා. ඒක තමයි හතරවන අදියර.

මම මේ ප්‍රකාශය කළේ වගකීමකින්. අගෝස්තු මාසයේ 02වන දා අපට ලංකාපුර රෝගියා හමු වුණාට පසුව, මම මේ ප්‍රකාශය කරන දවස වනවිට අපි 25,000කට අධික පිරිසක් සමාජයෙන් පරීක්ෂා කර තිබුණා. ඒ කිසිම පරීක්ෂණ නියැදියකදී රෝගියෙකු හමු වුණේ නැහැ. රෝහල්වල clinicsවල දවසකට දහ දෙනෙකු ගණනේ නියැදි පරීක්ෂා කරන්න කියලා අපි හැම ප්‍රධාන රෝහලකටම උපදෙස් ලබා දීලා තිබුණා. එතැනදීත් අපට රෝගීන් හමු වුණේ නැහැ. ඊට අමතරව, නියුමෝනියාව වාගේ ලෙඩක් හැදිලා කවුරු හෝ මැරිලා තිබෙනවා නම් ඒ රෝගියාගේ මරණ පරීක්ෂණයට ඉස්සෙල්ලා සාම්පල් අරගෙන පරීක්ෂා කරන්න කියලා අපි කිව්වා. එහෙම කිසිවෙකු හමු වුණේත් නැහැ. ඒ අනුව අපි හිටියේ තුන්වැනි අදියරේ. තුන්වැනි අදියරේ හිටපු රටක,

[ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය ]

තැනින් පොකුරු හමු වෙමින් තිබූ රටක, ඒ පොකුරු හම්බ වෙන්නේ නැතිව, cases නැතිව මාස කීපයක් පැවතුණා. එම නිසා නවවැනි මාසයේ තුන් වැනි දා මා කළ ප්‍රකාශයේ ආරම්භයේදී මම කියා තිබෙනවා, "ශ්‍රී ලංකාව කොවිඩ්-19 රෝගය සමාජය තුළින් තුරන් වූ රටක් යැයි අපි කියනවා. හැබැයි, යම්කිසි විධියකට-" ආදි වශයෙන්. ඒ ආකාරයට දිගටම කියාගෙන ඇවිත් මා ඒ කතාවේ කියා තිබෙනවා, "අපේ ලංකාවේ මිනිස්සු අපට කියනවා, මැද පෙරදිගින් සහ වෙනත් රටවලින් අපේ මිනිස්සු ගෙන එන්න කියලා. පිටරටවල ඉන්න අපේ ජනතාව අපේ රටට ගෙන එන්න කියලා අපට නිරන්තරයෙන් ඉල්ලීම් ඉදිරිපත් කරනවා. ඒ ඉදිරිපත් කරන ඉල්ලීම් අපට ඉටු කළ හැකි වන්නේ ලංකාවට දරාගත හැකි ආකාරයටයි." කියලා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා කියවපු, ඒ ප්‍රකාශයේ මුල කොටස හැරුණු විට ඉතිරි ටිකත් අහන්න. මා එහි කියා තිබෙනවා, "පිට රටවල ඉන්න දහස් ගණන් සෙනඟ අපි සීමාවක් ඇතුළතයි ගෙන එන්නේ. පිට රටවල වැඩට ගිය අපේ ශ්‍රී ලාංකිකයන්, විදේශ විනිමය අපට හොයා දීපු අය ලංකාවට ගෙන එන්න කියනවා. හැබැයි, අපට දැරිය හැකි ධාරිතාවකටයි ගෙන එන්න වෙන්නේ. යම්කිසි කාන්දුවක් ඇති වුණොත්, මේ රෝගය ලංකාවේ ආයෙත් පැතිරෙන්න පුළුවන්." කියලා. ඒ මිනිත්තු තුනේම -ඒ කථාවේම- අග කොටසේදී මා එසේ කියා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ කථාවේ පළමු තත්ත්පර කිහිපය විතරක් අහන්නේ නැතිව ඒ ප්‍රකාශයේ අවසාන කොටසත් අහන්න කියලා. "මේ රෝගය ඉතාම කිට්ටුව ඉන්න අයගේ හුස්මෙන් පවා - respiration මඟින් - බෝ වෙන්න පුළුවන් රෝගයක්. එම නිසා අපි පරිස්සම් වෙන්න ඕනෑ. පිට රට ඉන්න අය අපේ රටට ගෙන ඒමේදී අපට දරන්න පුළුවන් විධියටයි ගෙන්වන්නේ. Quarantine centresවලට දමන්න පුළුවන් විධියටයි ගෙන එන්නේ. එම නිසා අපි ඒ අය ඉතාම වගකීමකින්, ඉවසීමකින්, කාණ්ඩ වශයෙන් ලංකාවට ගෙන එනවා. යම්කිසි විධියකින් කාන්දුවක් ඇති වුණොත්, මේ තත්ත්වය වෙනස් වෙන්න පුළුවන්." කියන එක ඒ කථාවේදීම මා කියා තිබෙනවා, ගරු කථානායකතුමනි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, එම නිසා මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මා කළ ප්‍රකාශය හරියට අහන්නේ නැතිව, මගේ කථාවේ මුල කොටස විතරක් ඉදිරිපත් කරලා කතා කරමින් පාර්ලිමේන්තුවේ කාලය නාස්ති වන විධියට කටයුතු කරන්න එපා කියලා. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I think that is enough.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා කලින් ඉදිරිපත් කළේ, එතුමිය සැප්තැම්බර් මාසයේ කළ ප්‍රකාශයක්. එතුමිය කිව්වා, පරීක්ෂණ කරලා මාස ගණනක් තිස්සේ රෝගියෙකු වාර්තා වුණේ නැති නිසා එතුමිය එසේ ප්‍රකාශ කළා කියලා. මා ඉදිරිපත් කරනවා, එතුමිය අප්‍රේල් මාසයේ කළ ප්‍රකාශයක්. [බාධා කිරීමක්]

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඒකත් ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පොඩ්ඩක් ඉන්න. මේක අප්‍රේල් මාසයේ කළ ප්‍රකාශයක්. [බාධා කිරීමක්]

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඒකත් ඉදිරිපත් කරන්න. ඔබතුමාට ඕනෑ දේ කියන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. අප්‍රේල් මාසයේ. [බාධා කිරීමක්] අහගෙන ඉන්න. [බාධා කිරීමක්] මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ කළ ප්‍රකාශයක්. එහි සඳහන් වෙනවා, "කොරෝනා වයිරසය මෙරට ජනතාව අතර ව්‍යාප්ත වන තත්ත්වයක් නැති බවත්, මහජනතාව අතර බෝ වීමක් සිදු වන්නේ නැති බවත් සෞඛ්‍ය ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය ප්‍රකාශ කළාය." කියා. අප්‍රේල් මාසයේ එහෙම කියන්නේ කොහොමද? [බාධා කිරීම්] අප්‍රේල් මාසයේ එහෙම කියන්නේ කොහොමද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වීරවංශත් කිව්වා. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනෙක් එක මේ- [බාධා කිරීම්] දොස්තර මහත්වරුන් කියපු ඒවා- [බාධා කිරීම්]

**ගරු පවිත්‍රාදේවි වන්නිආරා-ච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පවිත්‍රා වන්නිආරච්චි අමාත්‍යතුමිය, කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දොස්තර මහත්වරුන්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now, she wants to give the reply. You have made your statement. Let her reply now.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු කථානායකතුමනි, එතුමා මීට කලින් එකක් කිව්වා. අපි දැන් ඒකට උත්තරය දුන්නා. ඊළඟට, මා කියන්නේ ආයේ,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
It is very unfair to switch off my mike.

ගරු කථානායකතුමනි, අප්‍රේල් මාසයේ කිව්වේ මොන දත්ත පදනම් කරගෙන ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඡන්දය පදනම් කරගෙන!

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්, ඡන්දය නිසා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Right. Now, you have asked that question. You need not repeat it. She will answer it.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනෙක් කාරණය මේකයි. GMOA එක හැමදාම කිව්වා, MRI එක හැමදාම කිව්වා, මේක අළු යට ගිනි පුපුරු වාගේ තිබෙනවා, ආයෙත් ඉස්මතු වෙනවා කියලා. ඒ අය හැම දාම එහෙම කිව්වා. ඒවා පිළිගත්තේ නැහැ, ඡන්දය නිසා. ලෝකයටම කිව්වා, කොරෝනා ඉවරයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let her reply. Now, you stop your explanation.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
චීන ආණ්ඩුව කරන සමීක්ෂණ, බොරු සමීක්ෂණ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, thank you. Hon. Minister, you go ahead.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු කථානායකතුමනි, මා හිතනවා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ කාලය තවදුරටත් නාස්ති කළ යුතු නැහැ කියලා. අප්‍රේල් මාසයේ- [බාධා කිරීම්] නැහැ, නැහැ. කියන්න ඉඩ දෙන්න. මට කථා කරන්න ඉඩ දෙන්න. ඉඳගන්න. [බාධා කිරීම්] මේකට උත්තරයක් දෙන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමනි, අප්‍රේල් මාසයේ කවදා හරි දවසක- [බාධා කිරීම්] මා දිනය හරියටම දන්නේ නැහැ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, අප්‍රේල් මාසයේ 25 වන දා කියලා දැන් ඔබතුමා කිව්වා නේ. ඒ හැම අවස්ථාවකම රටේ තිබෙන තත්ත්වය අනුව ඉතාම වගකීමකින් තමයි මා එම ප්‍රකාශ කළේ. ඒ හැම අවස්ථාවකම රට තුළ, සමාජය තුළ, හැම තැනකම කිසිම ආතතක්-පාතක් නැතිව රෝගීන් මතු වුණු තත්ත්වයක් තිබුණේ නැහැ. මා ඒ තත්ත්වය ප්‍රකාශයට පත් කළා නම් කළේ ජනතාව අපට සහයෝගය ලබා දුන්නොත් මේ රෝගය මර්දනය කරන්න අපට පුළුවන් කියමින්.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ විපක්ෂ නායකතුමාත් ඡන්දය කාලයේ 'මාස්ක්' නැතිව රට පුරා ගියේ මේ රටේ කොරෝනා රෝගය නැහැ කියලා ඔබතුමන්ලාටත් විශ්වාසයක් තිබුණු නිසායි. ඒ හින්දා තමයි ඔබතුමන්ලා ඒ ආකාරයට ඡන්දය කළේ. ඒ හින්දා තමයි ඔබතුමන්ලා 'මාස්ක්' නැතිව ගියේ. ඒ වෙලාවේ රටේ තිබුණු තත්ත්වයයි අපි කිව්වේ. හැබැයි, හතරවන අදියර ලංකාවේ තවම නිර්මාණය වුණේ නැහැ. අපි ඒක කියන්න ඕනෑ. මුළු සමාජයෙන්ම -හැම තැනින්ම- රෝගීන් මතු වුණේ නැහැ. අපි ඒක කියන්නට ඕනෑ. ඇති වෙච්ච ඇත්ත තත්ත්වයයි අපි කිව්වේ. මට ඊට වඩා දෙන්න උත්තරයක් නැහැ, ගරු කථානායකතුමනි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, පූ. භා. 11.10ට, 2020 ඔක්තෝබර් 20 වන අඟහරුවාදා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி, மு. ப.11.10க்கு, பாராளுமன்றம் 2020 ஒக்ரோபர் 20, செவ்வாய்க்கிழமை மு. ப.10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 11.10 a.m. until 10.00 a.m. on Tuesday, 20th October, 2020.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர்  தமது உரையின்  இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of  Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.